(1)

කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ බී 34119/1/15 දරන නඩුවේ වැඩිදුර වාර්තාව හා අධිකරණ නියෝග ලබා ගැනීම

H 027655 – 10,000 (2006/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

(P2 Orig. & Dup. B. & T.) 08/80

ශ්‍රී ලංකා පොලිසිය / [illegible]

මහේස්ත්‍රාත්වරයා වෙත සපයන තොරතුරු

[illegible]

| | | | |
|---|---|---|---|
| ලා. පො. පිටුව | FCID/ 144/15 | අධිකරණය | කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් |
| ලා. පො. ඡේදය | | | |
| ස්ථාන අංකය : අ. වා. ලේ. | | නඩුවේ අංකය | B.34119/1/15 |
| අ. ගා. වෛ. වා. ලේ. | | | |

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XI වැනි පරිච්ඡේදයේ

115 (1), (2), (3), (4), 120 (1), (2), (3) වැනි වගන්ති යටතේ

මහේස්ත්‍රාත් පරීක්ෂණය කිරීමට වාර්තාව

[illegible] 1979 ஆம் ஆண்டின் 15 ஆம் இலக்க [illegible] 115 (1), (2), (3), (4), 120 (1), (2), (3) [illegible]

කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් තුමා,

මහේස්ත්‍රාත්වරයා වෙතට,

[illegible],

ගැසකට්ටුවක් අනුදැනුමින් විදේශ මුදල් රටට ගෙන්වීම සහ එකී මුදල් යොදවා කොළඹ ආසිරි රෝහලට අයත් [illegible]

හා දිවයිනේ විවිධ ප්‍රදේශවල දේපල මිලදී ගැනීම සම්බන්ධයෙන් ලද තොරතුරක් මත

පොලිස්පති තුමාගේ නියෝග පරිදි

2015.07.29 වැනි දින කරන ලද පැමිණිල්ල විභාග කළ බව..මුදල් අපරාධ විමර්ශන

කොට්ඨාශයේ ඒකක 04 හි ස්ථානාධිපති ප්‍ර.පො.ප. රණසිංහ එන මම ගෞරවයෙන් වාර්තා කරමි

[illegible]

[illegible]

(.....) [illegible]

[illegible]

[illegible]

| | |
|---|---|
| [illegible] | ......(කරුණාකර අමුණා ඇති පිටු බලන්න) |
| [illegible] | ........................ |
| [illegible] | ........................ |
| [illegible] | ........................ |
| මහේස්ත්‍රාත් අධිකරණයට යවන ලද්දේ විත්තිකරුවන් ද නැතහොත් ඇප පිට ද ගත්ත වීද, ඇප පිට තබා, ඇප මුදල් ඇතිබව ප්‍රමාණ | ........................ |
| [illegible] | ........................ |
| අධිකරණයට ඉදිරිපත් කරන දෙයින් යම් තොරතුරක් ද යන්නට වේ | ........................ |
| [illegible] | ........................ |

........................

විමර්ශනය භාර නිලධාරියා.

[illegible]

2015.08.28 දින ඉදිරිපත් කරන ලද මුල් බී වාර්තාව හා ඉන් පසුව ගොනු කරන ලද අනෙකුත් වැඩිදුර වාර්තා හා සබැඳේ.

2. සැකසහිත අන්දමින් රුපියල් බිලියන 2.6 ක මුදලක් යොදවා කොළඹ 07, හෝර්ටන් පෙදෙස, අංක 37 දරණ ස්ථානයේ පිහිටි ආසිරි රෝහලට අයත් ඉඩමක් මිලදී ගැනීමක් සම්බන්ධයෙන් ලද තොරතුරක් මත මෙම විමර්ශනය සිදු කරන ලදී. ගරු අධිකරණයෙන් ලබා ගන්නා ලද අධිකරණ නියෝග අනුව ප්‍රශ්නගත දේපල මිලදී ගැනීම සඳහා මුදල් යෙදවූ ආකාරය සම්බන්ධයෙන් බැංකු ලේඛන ලබා ගෙන විමර්ශන සිදු කිරීමේදී එම දේපල මිලදී ගැනීම සඳහා නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් රොමේෂ් මද්දුම බංඩාර කරල්ලියද්ද යන අයට අයත් බැංකු ගිණුම් හර කොට බැංකු අණකර මගින් දේපල විකුණුම්කාර ආසිරි සෙන්ට්‍රල් හොස්පිට්ල් ප්‍රයිවට් ලිමිටඩ් වෙත රුපියල් බිලියන 2.7 ක මුදලක් ගෙවා ඇති බව අනාවරණය විය.

3. තවදුරටත් විමර්ශනය කිරීමේදී රොමේෂ් මද්දුම බංඩාර කරල්ලියද්ද යන අය විසින් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් යන අය සමග ඇති කරගන්නා ලද ගිවිසුමක් අනුව මෙම මුදල් රොමේෂ් මද්දුම බංඩාර කරල්ලියද්ද යන අයගේ ගිණුම් වෙත විදේශ රටවලින් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බවත් එම මුදල් තම ගිණුම් වෙත ගෙන්වා ගැනීම සඳහා රොමේෂ් මද්දුම බංඩාර කරල්ලියද්ද වෙත එම මුදලින් 0.5% ක මුදලක් ලැබෙන බවට ගිවිසුමගතව ඇති බවත් අනාවරණය විය.

4. මේ සම්බන්ධයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් යන අයගේ ප්‍රකාශ සටහන් කිරීමේදී තමන් ඇමරිකාවේදී හඳුනාගත් ඇමරිකානු ජාතික මයිකල් ජේකොබ්ස් හා රැබී හැඩලර් ජේකොබ්ස් යන අය 2013 වසරේදී ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සඳහා පැමිණි අවස්ථාවකදී තමන් හමුවූ බවත් ඒ අවස්ථාවේදී ඇමරිකාවේ අලාමෝ නිව් මෙක්ෂිකෝ නගරයේ ප්‍රධානී ස්ටැන්ලි ඩේවිඩ් හෙරේරා යන අය විසින් එම නගරයේ එකතුවන බදු මුදල් ආයෝජනය කිරීම සඳහා සොයමින් සිටින බව දැන්වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ඉඩම් ඉදිරියේදී මිල විශාල වශයෙන් ඉහළ යන බැවින් ඒ සඳහා ආයෝජනය කිරීමට තමන් කළ යෝජනාව අනුව ඒ සඳහා එකගවී ඇමරිකාවට ගොස් ස්ටැන්ලි ඩේවිඩ් හෙරේරා යන අය හමුවී සාකච්ඡා කිරීමෙන් අනතුරුව රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා ස්ටැන්ලි ඩේවිඩ් හෙරේරා අතර 2013.10.01 දින ගිවිසුමක් අත්සන් කළ බවත් ප්‍රකාශ කරන ලදී. එකී ගිවිසුම ප්‍රකාරව ලැබෙන විදේශ මුදල් කළමණාකරණය සඳහා නියෝජිතයෙකු වශයෙන් (Escrow Agent) කටයුතු කිරීම සඳහා අංක 5/3, පිටකන්ද පාර, මහනුවර ලිපිනයේ පදිංචි නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් රොමේෂ් කරල්ලියද්ද යන අය රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් විසින් පත්කර ගත් බවත් ඒ සඳහා රොමේෂ් මද්දුමබංඩාර කරල්ලියද්ද හා ස්ටැන්ලි ඩේවිඩ් හෙරේරා යන අය අතර 2013.12.01 දිනැතිව ත්‍රිපුද්ගල ගිවිසුම අත්සන් කළ බවත් එකී ගිවිසුම අනුව රොමේෂ් මද්දුම බංඩාර කරල්ලියද්ද යන අයගේ ගිණුම් මාර්ගයෙන් ගෙන්වා ගන්නා විදේශ මුදල් වලින් 0.5% ක් රොමේෂ් මද්දුම බංඩාර කරල්ලියද්ද යන අයට ලබාදීමට එකගවී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

5. මීට අමතරව පහත සඳහන් සමාගම්වල අධ්‍යක්ෂවරුන් වශයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පූනාා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන පහත සඳහන් සමාගම් සංස්ථාගතකර ඇති බව අනාවරණය කර ඇත.

   I. එඩ්වඩ්ස් ප්ලාන්ටේෂන් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්, නො.57/2බී, රේල්වේ ඇවනියු, නුගේගොඩ.
   මෙම සමාගම පීවී 62079 යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2007.11.19 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පූනාා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 1000 ක් වන අතර අධ්‍යක්ෂවරුන් දෙදෙනා අතර කොටස් 500 බැගින් බෙදී ඇති බව සමාගමේ ලේකම් Mass Management Consultants (Private) Limited හි කළමණාකරු නෝලියන් යුක්තික මුණසිංහ දිසානායක යන අය අනාවරණය කර ඇත.

   II. ග්‍රීන්ඩ් ෆීල්ඩ් කන්සල්ටන්සි සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්, නො.57/2බී, රේල්වේ ඇවනියු, නුගේගොඩ.
   මෙම සමාගම පීවී 88548 යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2012.05.02 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පූනාා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 100,000 ක් වන අතර අධ්‍යක්ෂවරුන් දෙදෙනා අතර කොටස් 50,000 බැගින් බෙදී ඇති බව සමාගමේ ලේකම් Mass Management Consultants (Private) Limited හි කළමණාකරු නෝලියන් යුක්තික මුණසිංහ දිසානායක යන අය අනාවරණය කර ඇත.

III. ද මැන්ෂන් කැන්ඩි ප්‍රයිවට් ලිමිටඩ්, නො.57/2බී, රේල්වේ ඇවනියු, නුගේගොඩ.

මෙම සමාගම පීවී 85730 යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2012.05.02 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස්, රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අයගේ සහෝදරියක වන ජයකොඩි ආරච්චිලාගේ දීප්තිකා හසන්ජි යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 8,000 ක් වන අතර මෙම සමාගමේ කොටස් රු. 236,800,000.00 කට මිලදී ගෙන ඇති බවත් පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අයට කොටස් 7000 ක් හා රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් යන අයට කොටස් 1000 ක් බැගින් බෙදී ඇති බව සමාගමේ ලේකම් Managers & Secretaries (Private) Limited හි කළමණාකරු රුවන්පුර නිමේෂා නිවන්ති යන අය අනාවරණය කර ඇත.

6. ගරු අධිකරණයෙන් ලබා ගන්නා ලද අධිකරණ නියෝග මත රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස්, ඔහුගේ බිරිඳ වන පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස්, රොමේෂ් මද්දුම බංඩාර කරල්ලියද්ද හා ඔහු අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරන එල්.බී.කරල්ලියද්ද ඇසෝසියේට්ස් (CPC/KY/DS/2/4/3892) නමින් පවත්වා ගෙන යන බැංකු ගිණුම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී එම බැංකු ගිණුම් වෙත පහත සඳහන් පරිදි විදේශ රටවලින් මුදල් බැරවී ඇති බව අනාවරණයවී ඇත.

| Con No. | Account Holder & Account Number | Remitting Date | Amount | Remitting Country, Bank & Account Number | Total |
|---|---|---|---|---|---|
| 1. | HNB-DIGANA Branch 176010005299<br>L.B. Karalliyadda Associates No.7, Colombo Street, Kandy<br>Romesh Madduma bandara Karalliyadda | 13.03.2014 | USD 2,000,000.00 | HSBC,USA New york- Chang Yau Hung Alexander, Flat B 27/F, Willow Mansion, Tai kooShing HK-Ref No. 072349627 - 450581657833 | USD 26,034,907.00 |
| 2. | | 23.04.2014 | USD 500,000.00 | HSBC,USA New york -Chang Yau Hung Alexander, Flat B 27/F, Willow Mansion, Tai kooShing HK- Ref No. 113341722-450581657833 | |
| 3. | | 08.07.2014 | USD 7,000,000.00 | HSBC,USA New york-Chang Yau Hung Alexander, Flat B 27/F, Willow Mansion, Tai kooShing HK-Ref No. 188508239-450581657833 | |
| 4. | | 08.07.2014 | USD 3,000,000.00 | HSBC,USA New york-Chang Yau Hung Alexander, Flat B 27/F, Willow Mansion, Tai kooShing HK-Ref No. 189358313-450581657833 | |
| 5. | | 14.07.2014 | USD 5,000,000.00 | HSBC,USA New york-Chang Yau Hung Alexander, Flat B 27/F, Willow Mansion, Tai kooShing HK-Ref No. 195408804-450581657833 | |
| 6. | | 18.08.2014 | USD 350,000.00 | Citi Bank New york-Golding Associates, 299, Broadway Ste 710 New York NY 10 0071984 Ref No. Go142273596801-000003607676 | |
| 7. | | 12.09.2014 | USD 80,000.00 | Wells Forgo Bank, NA San Francisco, CA US -BIG Shoe World LLC, PO Box 1840, Helena/-Ref No. 2014091100116582-000003655577132 | |
| 8. | | 15.09.2014 | USD 1,999,954.00 | Deutsche Bank , Trust Company Americas, New york, NY US-Mr. John D Here, Reef view Dr St Georges, Grenada West Indies-Ref No. C450772RBK091214-0014147880081857935604 | |
| 9. | | 15.09.2014 | USD 5,999,980.00 | JP Morgan Chase Bank New york-Mr. John D Here, Reef view Dr St Georges, Grenada West Indies-Ref No. 4766700255FC-0014147880081857935604 | |
| 10. | | 15.09.2014 | USD 80,000.00 | Wells Fargo Bank NA NA San Francisco, CA US -BIG Shoe World LLC, PO Box 1840, Helena-Ref No. 2014091200059334-000003655577132 | |
| 11. | | 25.11.2014 | USD 5,000.00 | Wells Fargo Bank NA NA San Francisco, CA US -Jerry M Bond, 6939, Columbus AVE VAN NUYS-Ref No. 20141124001275515-000008461795414 | |
| 12. | | 25.11.2014 | USD 19,973.00 | Citi Bank, New york-William Witwicki 384,wLawerence HA RRIS HWY,Slocomb US-Ref No. C0043286305001-CH 66160 | |
| 13. | HNB-Kandy S/A No:- 0188020881185 Romesh Madduma bandara Karalliyadda | 30.06.2015 | USD 500,000.00 | DBS-Mrs. Yingjun Liang, No. 20, Shengli 4 Street Ronggui Block Shunde dis Foshan City Guandong, China. | USD 9,999,950.00 |
| 14. | | 30.06.2015 | USD 5,000,000.00 | -Do- | |
| 15. | | 03.07.2015 | USD 3,500,000.00 | HSBC-Mrs. Ng Chi Man , Avenida Da Republica, No 42,Andar, A 8, Edif Long Vo, Macau | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 16. | | 2015.11.05 | USD 999,950.00 | Hare John Dudley, Bay View Recf Drive Po Box 3169 GR/ Cance Aux EpinesGermany (CH 6308663610001370000) | |
| 17. | NDB-Kandy<br>101000260558<br>L.B.KaralliyaddaAssociares<br>Romesh Maddumabandara Karalliyadda | 23.12.2013 | USD 4,999,990.00 | Mr. Chang Yan Hung Alexander Flat B,27/F,WillowMasnion Tai kooShing HK A/C No.450581657833 HSBC Hong Kong | USD 14,534,930.00 |
| 18. | | 24.12.2013 | USD 6,999,990.00 | -Do- | |
| 19. | | 02.01.2014 | USD 999,990.00 | -Do- | |
| 20. | | 17.01.2014 | USD 139,990.00 | -Do- | |
| 21. | | 17.01.2014 | USD 280,000.00 | Mr. Chang Yan Hung Alexander Flat B,27/F,WillowMasnion Tai kooShing HK A/C No.773817267882 HSBC Hong Kong -Do- | |
| 22. | | 21.01.2014 | USD 34,990.00 | -Do- | |
| 23. | | 21.01.2014 | USD 79,990.00 | -Do- | |
| 24. | | 04.03.2015 | USD 999,990.00 | Mr.Mok Wing ninElat B23/F,BLK 3Parc Palais 18 Wylie Road HoMan Tinkln | |
| 25. | HNB-Kurunegala C/A No.019010010859 Edwards Plantation Management (pvt) Ltd | 14.11.2013 | USD 500,000.00 | Deutsche Bank Trust Company America, New York A/C No. 2013111300126159 New Mexico State Bar Foundation IOL | USD 1,100,000.00 |
| 26. | | 03.11.2013 | SGD 279.03 | CEO Suite Private LTD, 50, Raffles Place 37-00, Singapore 04Overseas Chinese Banking Corporation Limited.Singapore SGA/c No 0101419813 | SGD 279.03 |
| 27. | | 10.09.2013 | USD 300,000.00 | Decagon Company Limited, 20239, 23rd Ave NW A/C No.000016935801 Bank Of America New York | |
| 28. | | 27.08.2013 | USD 300,000.00 | Do - | |
| 29. | HSBC-Bambalapitiya S/A No:-005184973040 Punya Priyangi Menike Edwards | 2012.09.10 | USD 19,975.00 | Mrs. Ho Mei MeiTrindy, 370 G Alexandra Road 04-07 Singapore 159960 Singapore HSBC 269418178 Ref. YIRO-92477A/c No 151467545221 | USD 304,780.00 |
| 30. | | 2012.09.18 | USD 64,925.00 | Mrs. Ho Mei MeiTrindy, 370 G Alexandra Road 04-07 Singapore 159960 Singapore HSBC 262377384Ref. NIYO-00095A/c No 151467545221 | |
| 31. | | 2012.09.21 | USD 14,985.00 | Canada –CAHKBC452015065150- CT Andy | |
| 32. | | 2012.09.25 | USD 9,985.00 | Canada –CAHKBC452015065150- CT Andy | |
| 33. | | 2012.09.26 | USD 19,975.00 | Mrs. Ho Mei MeiTrindy, 370 G Alexandra Road 04-07 Singapore 159960 SG HSBCBank Code 000038369Ref. YIRO-92477A/c No 151467545221 | |
| 34. | | 2012.10.05 | USD 24,985.00 | Canada –278418442- CT Andy | |
| 35. | | 2012.10.25 | USD 99,980.00 | Canada –2983504 16- Mozaad -Irani | |
| 36. | | 2012.10.30 | USD 49,970.00 | Canada –Bdecagan Company LTD | |
| 37. | PABC-Kollupitiya A/C No:-033665810114 Punya Priyangi Menike Edwards | 2013.05.09 | USD 25,000.00 | Dutchchas Bank of Company America New York-Frost Brown Toddllc Escrow Account, 3300 Great American Tower, 301 East Fourth Street, Ciniciniti oh 45202 | USD 3,100,600.00 |
| 38. | | 2013.05.13 | USD 1,350,000.00 | Dutchchas Bank of Company America New York-Decagon ComÉny Limited, 20239, 23rd, AVE NW | |
| 39. | | 2015.10.07 | USD 1,275,600.00 | Dutchchas Bank of Company America New York-Steeplechase Middle East Fze- PO Box 124463, Dubai, UAE 00971555516207 | |
| 40. | | 2015.10.20 | USD 450,000.00 | Dutchchas Bank of Company America New York-Steeplechase Middle East Fze- PO Box 124463, Dubai, UAE 00971555516207 | |
| 41. | HSBC-Bambalapitiya S/A USD No:- 0051 8497 3025 Punya Priyanji Menike Edwards | 2012.10.12 | USD 19,970.00 | America -1001086162 Ronald w Kilpatrick-2012101100147361 | USD 19,970.00 |
| 42. | HSBC-Bambalapitiya A/C No:-005184973001 Punya Priyanji Menike Edwards | 24.07.2015 | GBP 56,498.68 | GBN 230758WIPLPJ4- LondonFashion Flat Form LTD A/C No: 40042501496727 | GBP 240,116.11 |
| 43. | | 10.08.2015 | GBP 49,491.99 | GBN 07085APK35NKo- London Fashion Flat Form LTDA/C No: 40042501496727 | |
| 44. | | 21.08.2015 | GBP 24,460.31 | GBN 20085ANL90BNL- London Fashion Flat Form LTD A/C No: 40042501496727 | |
| 45. | | 02.09.2015 | GBP 49,883.13 | GBN 01095H8M0C668 - London Fashion Flat Form LTD A/C No: 40042501496727 | |
| 46. | | 20.02.2015 | GBP 15,000.00 | GBN16025H94CNT8G - London Fashion Flat Form LTD A/C No: 40042501496727 | |
| 47. | | 11.02.2013 | GBP 10,000.00 | GBN 08023933LZ2IO - London DH.Jayakody A/C No: 40021351655590 | |
| 48. | | 09.07.2015 | GBP 49,767.11 | GBN 080758WHC5CLC- London D.Jayakody A/C No: 40021351655590 | |
| 49. | Sampath Bank-Kandy (KCC) Branch 012310000831 The Manson Kandy (pvt) LTD | 2015.04.08 | USD 150,038.60 | Carbogen Mining (PTE) LTD, 10, Collyer Quay 10-01 OceanFinancial Centre, Singapore 04. Overseas Chinese Banking Corporation Limited. Singapore SGA/c No 503240194301 | USD 156,413.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 50. | Rienzie Mahesh Kumara Edwars, Punya Priyanji Menike Edwards | 2015.03.10 | USD | 6,375.00 | Australia 131016347 | |
| 51. | | 2015.06.24 | GBP | 15,210.00 | London MIDC GB22 - 40042501496727 | GBP 34,204.00 |
| 52. | | 2015.06.29 | GBP | 18,994.00 | London MIDC GB22- 40042501496727 | |
| 53. | Nation trust Bank Cinamon gardns C/A No:- 011108007420 R.M.K. Edwards P.P.M.Edwards | 2011.06.30 | USD | 19,157.09 | Alabama Construction consortium (incoming Payments) | USD 19,157.09 |
| 54. | | 2016.05.20 | EUR | 17,570.00 | Jakarta- Indonesia - | EUR 27,550.69 |
| 55. | | 2010.05.26 | EUR | 9,980.69 | MohomadNazeer Mods Al Asab 6277, Auh, Auh, United Arab Emirates | |
| 56. | | 2016.04.20 | USD | 55.13 | GB98BOFA16505046955037 Expedia Lodging Partner Services Sarl Geneva, Switzerland Bank of America -London | |
| 57. | Sampath Bank (Kandy City Center) 012310001072 Green Fields Consultancy Services Rienzie Mahesh Kumara Edwards Punya Priyanji Menike Edwards | 2016.03.16 | USD | 20,700.00 | Standard Chartered Bank- Mumbai | USD 20,700.00 |
| 58. | | 2016.03.10 | GBP | 970.00 | Bank of Ceylon London | GBP 970.00 |
| Total | | | | | USD<br>GBP<br>SGD<br>EUR | 55,291,407.09<br>275,290 .11<br>279.03<br>27,550.69 |

7. ඉහත වගුව ප්‍රකාරව ලද විදේශ මුදල් යොදවා පහත දේපල මිලදී ගෙන ඇති බව අනාවරණය වී ඇත.

| අනු අංකය | ඔප්පුව ලියා සහතික කළ දිනය | ඔප්පු අංකය | ඔප්පුව ලියා සහතික කළ නොතාරිස් වරයාගේ නම | වටිනාකම (රුපියල්) | මුද්දර ගාස්තු | නොතාරිස් ගාස්තු | දේපල ගැනුම්කරුගේ නම | ඉඩමේ නම / පිහිටි ලිපිනය |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | 2015.07.13 | 1031 | සමාධි තරංගා ගජවීර - කොළඹ | 2,700,000,000/= | 107,999,000/= | 40,500,000/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | අංක 37, හෝර්ටන්, පෙදෙස, කොළඹ 07 |
| 2. | 2014.11.24 | 10396 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 930,000,000/= | 4,688,000/= | 13,950,000/= | ට්‍රැඩිෂන් ලංකා ප්‍රයිවට්ලිමිටඩ් | අංක 17, කොම්බ්‍රිජ් පෙදෙස, කොළඹ 07 |
| 3. | 2014.07.10 | 10259 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 375,200,000/= | 15,007,000/= | 5,628,000/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | අංක 47/1, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07 |
| 4. | 2014.07.10 | 10260 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 345,450,000/= | 13,817,000/= | 5,181,750/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | අංක 14, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07 |
| 5. | 2014.07.16 | 10265 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 300,000,000/= | 11,999,000/= | 4,500,000/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | ශාන්ත ජේම්ස්, රජපිහිල්ල, මහනුවර |
| 6. | 2014.07.16 | 10266 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 50,000/= | 1,500/= | 750/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | ශාන්ත ජේම්ස්, රජපිහිල්ල, මහනුවර |
| 7. | 2014.01.08 | 10058 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 12,000,000/= | 479,000/= | 180,000/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | අරබෙගමවත්ත, බැරගම, හාරිස්පත්තුව |
| 8. | 2014.01.08 | 10059 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 8,000,000/= | 599,000/= | 120,000/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | අරබෙගමවත්ත, බැරගම, හාරිස්පත්තුව |
| 9. | 2014.03.20 | 10128 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 345,000/= | 13,176/= | 5,175/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | සල්ලි, ත්‍රිකුණාමළය |
| 10. | 2014.03.20 | 10129 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 1,302,928/= | 51,118/= | 19,543/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | සාම්පල්තිවු, තිකුණාමළය |
| 11. | 2014.03.20 | 10130 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 42,825,320/= | 1,712,013/= | 642,379/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | පෙට්නිකාරත්තොට, ත්‍රිකුණාමළය |
| 12. | 2014.10.01 | 1178 | චන්දන එස්.පී.ගොඩකන්දගේ -ගාල්ල | 15,000,000/= | 599,000/= | 225,000/= | පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | කැප්පුඇල වත්ත, හිනටිගත, ගාල්ල. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 13. | 2014.07.30 | 10274 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 351,486,000/= | 14,058,440/= | 5,272,290/= | පුනාසා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | කැප්පුඇල වත්ත, හිනටිගත, ගාල්ල. |
| 14. | 2014.01.20 | 10068 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 163,362,500/= | 6,533,500/= | 2,450,437/= | පුනාසා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | ලයිට් හවුස්, කොටුව, ගාල්ල |
| 15. | 2014.01.30 | 32 | පී.එස්.ආර්.ප්‍රේමලාල් - මහනුවර | 4,500,000/= | 179,000/= | 67,500/= | පුනාසා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | බුලංකුලම, මහවෙල, අනුරාධපුරය |
| 16. | 2014.10.08 | 10343 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 40,000,000/= | 1,599,000/= | 6,000,000/= | පුනාසා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | අංක 5/5, යුනික්විව් පාර, නුවරඑළිය |
| 17. | 2014.10.07 | 10341 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 10,000,000/= | 399,000/= | 150,000/= | පුනාසා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | අංක 9/32, යුනික්විව් පාර, නුවරඑළිය. |
| 18. | 2013.12.24 | 10042 | ආර්.එම්.බී.කරල්ලියද්ද - මහනුවර | 150,000,000/= | 5,999,000/= | 2,250,000/= | පුනාසා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් | සුරන /හිල් රයිස්, මහගස්තොට , නුවරඑළිය |
| | | | | 105,000,000/= | - | - | ගෘහ භාන්ඩ සඳහා | |
| එකතුව | | | | 5,554,521,748/= | 185,735,747/= | 87,142,824/= | | |
| මුළු එකතුව | | | | 5,827,397,319/= | | | | |

8. ඉහත දේපල මිලදී ගැනීම සඳහා යොදවන ලද විදේශ මුදල් ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, මැලේසියාව, සිංගප්පූරුව, හොංකොං හා එක්සත් අරාබි එමීර් රාජ්‍ය යන රටවල බැංකු පද්ධතිය හරහා මෙරට ඉතිරි කිරීමේ හා ජංගම ගිණුම් වෙත ලැබී ඇති බැවින් එම මුදල් වල මූලාශ්‍ර හඳුනා ගැනීම හා ඊට අදාල ගිවිසුම් සම්බන්ධව කරුණු තහවුරු කර ගැනීම සඳහා 2002 අංක 25 දරණ සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව ලිපි යොමු කර ඇත. ඒ අනුව 2016.01.05 දිනැතිව ඇමරිකා එක්සත් ජනපදය වෙත යොමු කරන ලද පණිවුඩයට අදාලව පුනාසා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය නමින් පැන් ඒෂියා බැංකුව කොල්ලුපිටිය ශාඛාවේ පවත්වාගෙන යන අංක 033665810114 දරණ ගිණුමට අවස්ථා දෙකකදී මුදල් එවීමට අදාල ගිණුම් වාර්තාවක් පමණක් යොමු කර ඇත. අනෙක් රටවලට යොමු කරන ලද පණිවුඩ වලට අදාලව මෙතෙක් සම්පූර්ණ පිළිතුරු ලිබී නොමැත. ඒ සම්බන්ධව වැඩිදුරටත් සිහි කැඳවීම් ලිපි යොමු කර ඇත.

9. ඉහත ගිවිසුම ප්‍රකාරව මෙරටට ගෙන්වා ගන්නා ලද විදේශ මුදල් යොදවා රියන්සි මහේස්කුමාර එඩ්වඩ්ස් යන අයගේ බිරිඳ වන පුනාසා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය නමින් මිලදී ගෙන ඇති සියළු දේපල ඇයගේ ඇවැමෙන් ඇමරිකානු ජාතික ස්ටැන්ලි ඩේවිඩ් හෙරේරා (US 51529413) යන අයට හිමි වන ආකාරයෙන් අන්තිම කැමති පත්‍රයක් සහතික කර ඇති බවට අනාවරණය කරමින් එම අන්තිම කැමති පත්‍රයේ පිටපතක් විමර්ශන කටයුතු සඳහා රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් විසින් මෙම කොට්ඨාශය වෙත ඉදිරිපත් කර ඇත.

10. එය 2014 අංක 38 දරණ ඉඩම් සන්තකය පැවරීම සීමා කිරීමේ පනත යටතේ වරදක් බව අනාවරණයවී ඇත.

11. ඒ අනුව මෙම විමර්ශනයට අදාලව ගතයුතු ඉදිරි නීතිමය පියවර සම්බන්ධයෙන් ගරු නීතිපති තුමාගේ උපදෙස් ලබා ගැනීම සඳහා උධෘත සීආර්5/34/2016 යටතේ 2016.11.09 දින යොමු කරන ලදී. එකී උධෘත අධ්‍යානය කර ගරු නීතිපතිතුමා විසින් 2016.11.25 දින ලිඛිතව ලබාදුන් උපදෙස් අනුව හා ඉන් අනතුරුව නිතිපති දෙපාර්තමේන්තුවේදී පවත්වන ලද විමර්ශන ප්‍රගතිය දැනුම්දීමේ සාකච්ඡාවලදී ලබාදුන් උපදෙස් අනුව වැඩිදුර විමර්ශන සිදු කරන ලදී. අවසන් වශයෙන් 2019.08.08 දින ලබා දෙන ලද ලිඛිත උපදෙස් අනුව වැඩිදුර විමර්ශන සිදු කරගෙන යන බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කරමි.

12. ඇමරිකා එක්සත් ජනපද අධිකරණ දෙපාර්තමේන්තුව මගින් 2016.12.22 දිනැතිව ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධාරී මාර්ගයෙන් සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව පණිවුඩයක් යොමු කරමින් මෙම රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් (N3592162) යන අයවලුන් හා Michale Jacques Jacobs ( U.K 529295486), Ruby Handler-Jacobs (U.S. 426247127), F.K.Ho (Singapore E1746632N), Lawrence Lester හා Rachel Gendreau) යන අයවලුන් විසින් "wire fraud,

conspiracy to commit wire fraud, aggravated identity theft, impersonation of employees of the United States, money laundering, and conducting monetary transactions in unlawful proceeds" යන වැරදි සිදු කරමින් 'Federal Reserve Bank of New York' ආයතනයෙන් බවට හඟවමින් වංචා සහගත ආයෝජන සැළැස්මක් ක්‍රියාත්මක කර ආයෝජකයින්ට ඇ.ඩො. මිලියන 54 ක පාඩුවක් සිදුකර ඇති බවටත් එම මුදල් විශුද්ධිකරණය සඳහා ශ්‍රී ලංකාව ඇතුළු රටවල් කිහිපයකට යොමු කර ඇති බවටත් දන්වා ඇති අතර ඒ සම්බන්ධයෙන් විමර්ශන සඳහා අදාල ගිණුම් 06 ක ගනු දෙනු අත්හිටුවීමට කටයුතුකර අවශ්‍යා සහයෝගය ලබා දෙන ලෙසද ඉල්ලා ඇත. තවද, ඉහත පුද්ගලයින්ට එරෙහිව United States District Court Southern District of New York අධිකරණයේ නඩු පවරා ඇති බවටද දන්වා එම අධි චෝදනා පත්‍රයේ පිටපතක්ද යොමු කර එකී නඩුව සඳහා සඳහා අවශ්‍ය ලේඛණ ලබා ගැනීම සඳහාද එමගින් ඉල්ලීම් කර ඇත. මෙම ඉල්ලීම හා සම්බන්ධ කරුණු රහසිගතව තබා ගන්නා ලෙසටද එමගින් ඉල්ලීම් කර ඇත.

15. 2011 අංක 40 දරණ පනතින් සංශෝධිත 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 35 (4) (ජ) වගන්තියේ නීති විරෝධී ක්‍රියාකාරකම යන්නට "ශ්‍රී ලංකාවෙන් පිටත යම් අධිකරණ බලසීමාවක් තුලදී සිදු කරන ලද ඒ අධිකරණ බලසීමාව තුල වරදක් සංස්ථාපනය විය හැකි" වන වරදක් නීති විරෝධි ක්‍රියාකාරකමක් වශයෙන් අර්ථ නිරූපනය කර ඇත. ඒ අනුව මෙහිදී 2011 අංක 40 දරණ පනතින් සංශෝධිත 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව මුදල් විශුද්ධිකරණය වරද සිදුකර ඇති බව අනාවරණයවේ. ඒ අනුව 2019.09.02 දින මෙම විමර්ශනයට පාදක කර ගැනීම සඳහා ඉහත චෝදනා පත්‍රයේ පිටපතක් හා ඊට සම්බන්ධිත ලේඛණ 2002 අංක 25 දරණ සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව ගෙන්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධාරී මගින් ලිපි යොමු කරන ලදී.

16. ඉහත ඡේද 6 අනුව ලැබී ඇති විදේශ මුදල් ප්‍රමාණය ඇ.ඩො. 55,084,868.50 ක් හා බ්‍රිතාන්‍ය පවුම් 255,101.22 ක් වන අතර එම මුදල දළ වශයෙන් ශ්‍රී ලංකා රුපියල් 7,246,268,310.80 වේ. දේපල මිලදී ගැනීම සඳහා යොදවා ඇති මුදල ශ්‍රී ලංකා රුපියල් 5,827,397,319/= ක් පමණ වන බැවින් ඉතිරි මුදල් සම්බන්ධයෙන් කරුණු අනාවරණය කර ගැනීම සඳහා වැඩිදුර විමර්ශන සිදු කරන ලදී. ඒ අනුව රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනාා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරන පහත සමාගම් සංස්ථාගත කර ඇති බව අනාවරණය විය. මෙම සමාගම්වල ඉහත මුදල් ආයෝජනය කර ඇත්ද යන්න සම්බන්ධයෙන් අනාවරණය කර ගැනිම සඳහා වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යමි.

I. ආශා මැන්ෂන් ප්‍රයිවට් ලිමිටඩ්, නො. 37, හෝර්ටන් පෙදෙස, කොළඹ 07.

මෙම සමාගම පීවී 116259 යටතේ 2016.09.06 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනාා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 1000 ක් වේ. රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් අයට කොටස් 450 ක්ද පුනාා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අයට කොටස් 450ක්ද පැරඩයිස් හෝල්ඩින්ස් ලිමිටඩ් වෙත කොටස් 100 ක් පවතින බව සමාගමේ ලේකම් Managers & Secretaries (Private) Limited හි කළමණාකරු රුවන්පුර නිමේෂා නිවන්ති අනාවරණය කර ඇත.

මෙම සමාගම ලියාපදිංචි අංක 37, හෝර්ටන් පෙදෙස, කොළඹ 07 ලිපිනයේ පිහිටි දේපල පුනාා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් විසින් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් එස්.එම්.ඩබ්.එම්. සමරතුංග විසින් 2017.04.17 දින ලියා සහතික කරන ලද අංක 165 දරණ ඔප්පුව මගින් හෝර්ටන් ස්කොයාර් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම වෙත රුපියල් බිලියන 3 කට විකුණා ඇති අතර එදිනම එකී දේපල නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් තුෂාර සමන්පාලි අමරසිරි විසින් ලියා සහතික කල අංක 572 දරණ උකස් ඔප්පුව මගින් රුපියල් බිලියන 2.7 ට පුනාා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් විසින් හෝර්ටන් ස්කොයාර් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම වෙතින් බදු ගෙන ඇත.

මෙහි යෝජිත ගොඩනැගිලි සඳහා අනුමැතිය නොලැබීම හේතුවෙන් උකස්කරයේ සඳහන් කොන්දේසි අනුව දේපලට අදාල මුදල උකස්කරයේ සඳහන් කාලය තුල සමාගම මගින් පුනාා එඩ්වඩ්ස් යන අයට ගෙවා නොමැති බැවින් විකුණුම්කරය අවලංගු වී ඇති අතර ඇය විසින් ඉල්ලා සිටින අවස්ථාවක එම දේපල පවරාදීමට හෝර්ටන් ස්කොයාර් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම සූදානම්ව සිටින බව එම සමාගමේ අධ්‍යක්ෂ මුත්තු සාමි මනිවන්නන් යන අය ප්‍රකාශ කර ඇත.

ඉහත අංක 165 දරණ විකුණුම්කරය සඳහා මුද්දර ගාස්තු හා නොතාරිස් ගාස්තු වශයෙන් රුපියල් 139,499,000/= ක මුදලක් ගෙවා ඇති බවත් එම මුදල් ඉහත ව්‍යාපෘතිය සඳහා ආයෝජකයෙකු වශයෙන් ඉදිරිපත්වූ මැලේෂියානු විදේශ ගමන් බලපත් අංක A37928049 හිමි ජයා සුදීර් ජයරාම් යන අය විසින් ගෙවා ඇති බවද අනාවරණය වී ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යන බව ගරු අධිකරණය වෙත වාර්තා කරමි.

II. හයිරයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්, 57/9බී, රේල්වේ ඇවනියු, නුගේගොඩ. 57/9බී, රේල්වේ ඇවනියු, නුගේගොඩ.

මෙම සමාගම පීවී 108440 යටතේ 2015.09.17 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් හා ජයකොඩි ආරච්චිලාගේ දිප්තිකා හසන්ජි යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 1000 ක් වේ. පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අයට කොටස් 950 ක් හා ජයකොඩි ආරච්චිලාගේ දිප්තිකා හසන්ජි යන අය අයට කොටස් 50 ක් පවතින බව සමාගමේ ලේකම් Managers & Secretaries (Private) Limited හි කළමණාකරු රුවන්පුර නිමේෂා නිවන්ති යන අය අනාවරණය කර ඇත.

මෙම සමාගම මගින් ඩොන් ඇන්ඩ් ඩොන් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම සතු දේපලක් රුපියල් 250,000,000/= ට මිලදී ගැනීම සඳහා 2016.11.11 දිනැතිව ගිවිසුම්ගතව ඇති බවට අනාවරණය වීමෙන් පසුව ඒ සම්බන්ධව විමර්ශන සිදු කරන ලදී.

ඒ අනුව ඩොන් ඇන්ඩ් ඩොන් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමට අයත් බලයලත් මිනින්දෝරු එච්.එච්.ධර්මදාස විසින් මැන සාදන ලද 2011.10.22 අංක 219 දරණ පිඹුරේ නිරූපිත දේපලක් වන අක්කර 02 යි රූඩ් 01 යි පර්චස් 28.41 විශාල ඉඩම රුපියල් මිලියන 250 ට හයිරයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම වෙත විකිණීමට 2016.10.11 දිනැතිව අධ්‍යක්ෂ මණ්ඩලය ගෙන ඇති තීරණය අනුව හයි රයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් පුද්ගලික සමාගම මගින් රුපියල් මිලියන 125 ක මුදලක් ගෙවා ඇති බවත් ඉන් පසුව හයි රයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් පුද්ගලික සමාගමේ 2017.01.23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් ඉහත දේපල මිලදී ගැනීම අවලංගු කිරීම හේතුවෙන් ඒ වන විට ගෙවා තිබූ රුපියල් මිලියන 125 ක මුදලින් ඩොන් ඇන්ඩ් ඩොන් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම වෙත සිදුවූ පාඩුව වශයෙන් රුපියල් මිලියන 17.5 ක මුදලක් අය කර ගැනීමෙන් විකුණුම් ගිවිසුම අවලංගු කිරිමට සමාගම් දෙකෙහි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බවත් අනාවරණය වී ඇත.

මීට අමතරව ගාමිණි කොරෙයා පදනමට අයත් අංක 11 ග්‍රෙගරි පාර කොළඹ 07 ලිපිනයේ පිහිටි රූඩ් 03 පර්චස් 13 ක් විශාල දේපල රුපියල් 2,038,225,000/= ට මිලදී ගැනිමට ගිවිසුම්ගතවීම සම්බන්ධයෙන් අනාවරණයවීමෙන් පසුව ඒ සම්බන්ධව විමර්ශන සිදු කරන ලදී. එහිදී අනාවරණය වනුයේ පදනමට අයත් මෙම දේපල හයි රයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්න්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම වෙත රුපියල් 2,038,225,000/= ට විකිණීම සඳහා 2016.08.10 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල හා සාමාජික අනුමැතිය ලැබීමෙන් පසුව නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් පද්මිණි වසන්තා මුණසිංහ හා එන්.ඒ.අකුරටියගම විසින් 2016.08.10 දින අංක 1507/904 දරණ විකුණුම් ගිවිසුම ලියා සහතික කර ඇති බවයි. එමගින් විකුණුම් මිලෙන් 10% ක් එනම් රුපියල් 203,822,500/= ක මුදලක් හයිරයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම මගින් සම්පත් බැංකුව නුගේගොඩ ශාඛාවේ 2016.08.10 දිනැති අංක 075124 දරණ මුදල් අණකරය මගින් ගාමිණි කොරෙයා පදනම වෙත ගෙවා ඇත. ගිවිසුම අනුව 2016.12.10 දින වන තෙක් ගනු දෙනුව සිදුව නොමැති බැවින් 2017.03.03 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී හයිරයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම මගින් ගෙවන ලද අත්තිකාරම් මුදලින් රු. 18,344,025/= ක් එම අවස්ථාවේදී ගෙවීමටත් ඉතිරි මුදලින් රු. 165,096,225/= ක් ඉහත දේපල විකිණීමෙන් පසු හයිරයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම වෙත ගෙවීමටත් ඉතිරි මුදල වන රු. 20,382,250/= ක් පදනම වෙත සිදුවූ පාඩුව වශයෙන් අයකර ගැනීමට තීරණය කර ඇති බව අනාවරණයවී ඇත. ඒ අනුව හයි රයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම වෙත ගෙවිය යුතු රුපියල් 165,096,225/= ක මුදලක් ගාමිණි කොරෙයා පදනම සතුව පවතින බවත් අනාවරණය විය.

මේ අනුව විවිධ දේපල මිලදී ගැනිම සඳහා මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවමින් විවිධ ක්‍රම ඔස්සේ මුදල් විශුද්ධිකරණය සඳහා කටයුතු කරන්නේද යන්න සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යන බව ගරු අධිකරණය වෙත වාර්තා කරමි.

III. ට්‍රැඩිෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් නො.57/2බී, රේල්වේ ඇවන්‍යූ, නුගේගොඩ.

මෙම සමාගම පීවී 79191 යටතේ 2014.11.05 දින ග්‍රැෆියෝ ප්‍රයිවට් ලිමිටඩ් නමින් සංස්ථාගත කරන ලද සමාගමකි. එම සමාගමට අයත් අංක 17, කේම්බ්‍රිජ් පෙදෙස, කොළඹ 07 ලිපිනයේ පිහිටි ඉඩම සමාගමේ කොටස් මිලදී ගැනීමෙන් 2014.01.02 දින අධ්‍යක්ෂවරුන් වන පුනායා ප්‍රියන්ජී මැණිකේ එඩ්වඩ්ස්, රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා ජයකොඩි ආරච්චිලාගේ දිප්තිකා හසන්ජි යන අය විසින් අත්කර ගැනීමෙන් අනතුරුව සමාගම් නාමය ට්‍රැඩිෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් නමින් වෙනස් කර ඇත.

මෙම සමාගමේ කොටස් ප්‍රමාණය 57,199,902 ක් වේ. ඉන් කොටස් 57,199,900 ක් පුනායා ප්‍රියන්ජී මැණිකේ එඩ්වඩ්ස් නමින්ද එක් කොටස බැගින් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා ජයකොඩි ආරච්චිලාගේ දිප්තිකා හසන්ජි යන අය නමින් පවතින බව සමාගමේ ලේකම් චාර්ට් බිස්නස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ රන්වත්තගේ සුමිත් යන අය අනාවරණය කර ඇත. මෙම ග්‍රැෆියෝ ප්‍රයිවට් ලිමිටඩ් නමින් සමාගම සතු ඉහත දේපල මිලදී ගැනීම සඳහා රොමේෂ් මද්දුමබංඩාර කරල්ලියද්ද යන අයට අයට අයත් මහනුවර NDB බැංකුවේ පවත්වා ගෙන යන අංක 101000260558 දරණ ගිණුමෙන් 2013.12.30 දිනැතිව රු. 93,000,000.00 බැගින් නිකුත් කරන ලද අංක 289524, 289525, 289526, 289527, 289528, 289529, 289530, 289531, 289532 හා 289533 දරණ මුදල් අණකර මගින් ගෙවීම් සිදු කර ඇති බව අනාවරණය විය. නැවත මෙම සමාගමේ සියළු කොටස් 2017.08.09 දිනැතිව අංක 31, පීඑස්බී, ද එම්පයර්, 75ඒ, ගාලු පාර, කොළඹ 03 ලිපිනයේ පදිංචි ඇලෙක්ස් ඉන්ද්‍රජිත් ලවෙල් යන අයට රු. 5,000,000,000.00 ට විකුණා ඇති බව අනාවරණය වී ඇත. මේ සම්බන්ධව වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යන බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කරමි.

IV. සූර්යා ඉන්ටර් නැෂනල් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, නො. 16/ඒ2, මොනාච් රෙසිඩන්සීස්, ගාලු පාර, කොල්ලුපිටිය.

මෙම සමාගම පීවී 111792 යටතේ 2016.02.10 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් පුනායා ප්‍රියන්ජී මැණිකේ එඩ්වඩ්ස් හා එස්සැල්ල පතිරාජගේ මේරි බැසිලිකා යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 1000 ක් වේ. පුනායා ප්‍රියන්ජී මැණිකේ එඩ්වඩ්ස් යන අයට කොටස් 500 ක් හා එස්සැල්ල පතිරාජගේ මේරි බැසිලිකා යන අය අයට කොටස් 500 ක් පවතින බව සමාගමේ ලේකම් Managers & Secretaries (Private) Limited හි කළමණාකරු රුවන්පුර නිමේෂා නිවන්ති යන අය අනාවරණය කර ඇත.

මෙම සමාගමේ ලියාපදිංචි ලිපිනය වශයෙන් අංක 16/ඒ2, මොනාක් රෙසිඩන්සීස්, ගාලු පාර, කොළඹ 03 ලිපිනය සඳහන් වන අතර එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් අංක 15, සැතපුම් කණුව, කරදගොල්ල, මැල්සිරිපුර ලිපිනයේ ජාතික හැඳුනුම්පත් අංක 566331217වී හිමි එස්සැල්ල පතිරාජගේ මේරි බැසිලිකා නැමති මෙම විමර්ශනයේදී මින් පෙර හඳුනා නොගත් තැනැත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරන බව අනාවරණය වීම හේතුවෙන් ලියාපදිංචි ලිපිනයැති දේපල සමාගමට අයත්ද යන්න සම්බන්ධයෙන් විමර්ශනය කරන ලදි.

එහිදී අනාවරණයවූයේ මෙම මොනාක් රෙසිඩන්සිස්හි මහල් නිවස සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ අංක පීවී 109455 යටතේ 2015.10.29 දිනැතිව ලියාපදිංචි,අංක 127/5, පන්සල පාර, මහරගම ලිපිනයේ ටලෝස් කන්සල්ටින් ප්‍රයිවට් ලිමිටඩ් නැමති සමාගම මගින් එම මහල් නිවසේ පෙර හිමිකරු වන අංක 45/5, බාන්ස් පෙදෙස, කොළඹ 07 ලිපිනයේ පදිංචි Kenneth Gordon Mcalpine යන අයගෙන් රුපියල් මිලියන 52 කට 2016.02.11 වන දින මිලදී ගෙන ඇති බවයි.

මෙම ටලෝස් කන්සල්ටින් ප්‍රයිවට් ලිමිටඩ් නැමති සමාගමේ අධ්‍යක්ෂවරයා වශයෙන් හා එකම කොටස්කරු වශයෙන් ජාතික හැඳුනුම්පත් අංක 841810015 වී හිමි අළුේල ජයම්පති රාජසුන්දර වෛද්‍යාලංකාර යන අය කටයුතු කරන බව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්මේන්තුවෙන් ලබා ගන්නා ලද ලේඛණ අනුව අනාවරණය වී ඇත.

ඒ අනුව මෙම මහල් නිවස මිලදී ගැනිම සඳහා අත්තිකාරම් මුදලක් වශයෙන් රු. 2,000,000.00ක් මුදලින් විකුණුම්කරු වෙත ගෙවා ඇති බවත් Talos Consulting (Pvt)Ltd නමින් යුනියන් පෙදෙස, කොමර්ෂල් බැංකු ශාඛාවේ පවත්වා ගෙන යන අංක 1480045656 දරණ ගිණුම මගින් රු. 42,858,000.00 ක් විකුණුම්කරු වන Kenneth Gordon Mcalpine යන අය නමින් HSBC –Premier Center ශාඛාවේ පවත්වා ගෙන යන අංක 007-083645-001 දරණ ගිණුමට Fund Transfer වශයෙන් ගෙවා ඇති බවත් ඉතිරි රු. 7,142,000.00 මුදල මුදලින්

විකුණුම්කරු වෙත ගෙවා ඇති බවත් අනාවරණය විය. මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යන බව ගරු අධිකරණය වෙත වාර්තා කරමි.

V. කළම්බු ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්, නො.57/9බී, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ.

මෙම සමාගම පීවී 108439 යටතේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2015.09.17 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් හා ජයකොඩි ආරච්චිලාගේ දීප්තිකා හසන්ජි යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 1000 ක් වන අතර පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අයට කොටස් 950 ක් හා ජයකොඩි ආරච්චිලාගේ දීප්තිකා හසන්ජි යන අයට කොටස් 50 බෙදී ඇති බව සමාගමේ ලේකම් Managers & Secretaries (Private) Limited හි කළමණාකරු රුවන්පුර නිමේෂා නිවන්ති යන අය අනාවරණය කර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යන බව ගරු අධිකරණය වෙත වාර්තා කරමි.

VI. බොන්ඩ් ස්ට්‍රීට් මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්, 57/9ඒ, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ.

මෙම සමාගම පීවී 118621 යටතේ 2016.12.18 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 1000 ක් වේ. රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් අයට කොටස් 100 ක් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් කොටස් 900 බෙදී ඇති බව සමාගමේ ලේකම් Managers & Secretaries (Private) Limited හි කළමණාකරු රුවන්පුර නිමේෂා නිවන්ති යන අය අනාවරණය කර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යන බව ගරු අධිකරණය වෙත වාර්තා කරමි.

VII. ට්‍රැම්වෙල් කන්සල්ටන්සි සර්විස් ප්‍රයිවට් ලිමිටඩ්, 57/9ඒ, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ.

මෙම සමාගම පීවී 118593 යටතේ 2016.12.08 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 1000 ක් වේ. රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් අයට කොටස් 100 ක් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අයට කොටස් 900 පවතින බව සමාගමේ ලේකම් Managers & Secretaries (Private) Limited හි කළමණාකරු රුවන්පුර නිමේෂා නිවන්ති යන අය අනාවරණය කර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යන බව ගරු අධිකරණය වෙත වාර්තා කරමි.

එඩ්වඩ්ස් එස්ටේට්ස් ප්ලාන්ටේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, නො.57/2බී, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ.
මෙම සමාගම පීවී 62160 යටතේ 2007.11.26 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය කටයුතු කරනු ලබයි. සමාගමේ කොටස් ප්‍රමාණය 1000 ක් වේ. රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් යන අයට කොටස් 500 ක් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය අයට කොටස් 500 ක් පවතින බව සමාගමේ ලේකම් Mass Management Consultants (Private) Limited හි කළමණාකරු නෝලියන් යුක්තික මුණසිංහ දිසානායක යන අය අනාවරණය කර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යන බව ගරු අධිකරණය වෙත වාර්තා කරමි.

XI. එඩ්වඩ්ස් ඉන්වෙස්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්. අංක 32, පැපිලියාන පාර, නුගේගොඩ.

මෙම සමාගම පීවී 63280 යටතේ 2008.03.04 දින සංස්ථාගත කරන ලද සමාගමකි. මෙහි අධ්‍යක්ෂවරුන් වශයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය කටයුතු කරන අතර සමාගමේ කොටස් ප්‍රමාණය 1,000,000 කි ඉන් කොටස් 800,000 ක් රියන්සි මහේෂ් කුසාර එඩ්වඩ්ස් යන අයටත් කොටස් 100,000 ක් පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අයටත් කොටස් 100,000 ක් කැලිස්ටස් නීල් සුදර්ශන ෆොන්සේකා යන අයටත් පවතින බව සමාගම් ලේකම් Mass Management Consultants (Private) Limited හි කළමණාකරු නෝලියන් යුක්තික මුණසිංහ දිසානායක යන අය විසින් අනාවරණය කර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යන බව ගරු අධිකරණය වෙත වාර්තා කරමි.

17. ඉහත සමාගම් වලට අමතරව රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩස් යන අය අධක්ෂවරුන් වශයෙන් කටයුතු කරන පහත සදහන් ලාභ නොලබන ඇපයෙන් සීමිත සමාගම් සංස්ථාගතකර ඇති බවද අනාවරණයවී ඇත.

I. රෝයල් ටර්ෆ් ක්ලබ් නුවරඑළිය, අංක 37, හොර්ටන් පෙදෙස, කොළඹ 07.
මෙම සමාගම 2015.09.01 දින ජීඒ. 3072 යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත. මෙම ක්‍රීඩා සමාජය මගින් නුවරඑළිය තුරග තරග පිටිය බදු ගැනීම සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලදී. එම තුරග තරග පිටිය බදු දීමණාකරු වන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය මගින් රෝයල් ටර්ෆ් ක්ල්බ් නුවරඑළිය වෙත 2015.06.24 දින සිට වසර දෙකක කාලයක් සඳහා රුපියල් 110,000/= ක මාසික කුලියක් මත බදු දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇති අතර ඒ අනුව බදු මුදල වශයෙන් රු. 2,460,000/= ක් HSBC බැංකුවේ අංක 371362 දරණ චෙක්පත මගින් ගෙවීම් කර ඇත. මෙම බදු කාලසීමාව 2017.06.30 දිනෙන් අවසන් වීමෙන් පසුව 2018.04.30 දින දක්වා අදාල අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ අනුමැතිය මත බදුකාල සීමාව දීර්ග කර ඇති අතර 2017 වසරේ මාස දෙකක කාලයක් සඳහා බදු මුදල වශයෙන් රු. 296,769/= ක මුදලක් චෙක් පත් අංක 075080 මගින් ගෙවා ඇත. 2017.07.18 දින එවකට ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් වසර 10 ක කාලයක් සඳහා නුවරඑළිය තුරග තරග පිටිය බදුදීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017.08.09 දිනැතිව ලැබීමෙන් පසුව මිල ගණන් කැඳවා රොයල් ටර්ෆ් කලබ් නුරඑළිය වෙත මාසිකව රුපියල් ලක්ෂ 2 බැගින් වසර 10 ක කාලයක් සඳහා බදුදීමට ටෙන්ඩර් ප්‍රධානය කර ඇත. මේ සමග හිග බදු මුදල වශයෙන් පැවති රු. 593,538/= ක මුදලක් චෙක් පත් අංක 212771 මගින් ගෙවා ඇති අතර රොයල් ටර්ෆ් කලබ් නුරඑළිය මගින් ආරක්ෂක තැන්පතුවක් වශයෙන් රු. මිලියන 2 ක් 2018.04.11 දිනැති අංක 07072 දරණ චෙක් පත මගින් ගෙවා බවද අනාවරණය විය.

II. අත්වැල පදනම, අංක 57/2බී, රේල්වේ ඇවනියු, නුගේගොඩ. මෙම පදනම 2012.12.13 දින ජීඒ.2770 යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත.

18. තවද රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පූනාඝා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය නමින් හා ඔවුන් අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන සමාගම් නමින් පහත සඳහන් වාහන මිලදී ගෙන ඇති බවද අනාවරණය වී ඇත.

| | | |
|---|---|---|
| KU 0066 රේන්ජ් රෝවර් | KU 2222 බෙන්ස් | CAD 0080 බෙන්ස් |
| KY 1377 කියා ජීප් | CAF 4901 කියා ජීප් | 253-2738 ටොයෝටා ඩබල් කැබ් |
| HG 3553 නිසාන් මාර්ච් | LF2995 මහේන්ද්‍රා ට්‍රක් | DAF 0088 මහේන්ද්‍රා මැක්සිමෝ |
| PG6229 KDH වෑන් | NC 7461 ඩොල්පින් | PF 6670 ටොයෝටා හයිලැක්ස් |
| LF 4075 මහේන්ද්‍රා මැක්ස් | LE 4099 මිට්ෂුබිෂි ලොරි | LD 9855 ටිපර් |
| YM 1784 බජාජ් ත්‍රීවිලර් | UL1770 යමහා බයික් | BFD 2414 බජාජ් CT100 |
| UB 6505 TVS බයික් | UB 6497 යමහා බයික් | TT 3826 තැපැල් 90 |
| TW 3661 හීරෝ හොන්ඩා | BAT 0042 TVSබයික් | RA 8683 ටැෆේ ට්‍රැක්ටර් |
| SE 0408 ලැන්ඩ් මාස්ටර් ට්‍රැක්ටර් | | |

19. ඉහත සඳහන් දේපල වලට අමතරව පහත සඳහන් දේපල රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පූනාඝා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය විසින් මිලදී ගෙන ඇති බවට තොරතුරු ලැබී ඇති බැවින් මේ සම්බන්ධව වැඩිදුර විමර්ශන සිදුකරමින් පවතී.

- අනුරාධපුරය බුලංකුලම අක්කර 16 ක කුඹුරු ඉඩම
- අරඹේගම බැරගම අක්කර 10 ක කුඹුරු ඉඩම.
- මහනුවර පුපුරැස්ස ප්‍රදේශයේ අක්කර 20 ක ඉඩම
- බත්තරමුල්ල වැව පාරේ නිවසක් සහිත පර්චස් 54 ක ඉඩම
- අහංගම විලා මුයුරාමා හෝටලය
- මහනුවර බෝල්වලාන අක්කර 06 ක ඉඩම

මේ දක්වා විමර්ශනයේදී ලබා ගෙන ඇති සාක්ෂි කරුවන්ගේ සාක්ෂි සම්පිණ්ඩණය ඇමුණුම 1 වශයෙන් ගරු අධිකරණයට ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

20. රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරමින් සංස්ථාගත කර ඇති බවට හඳුනාගෙන ඇති ඉහත සමාගම් සම්බන්ධව හා මිලදී ගෙන ඇති ඉඩම් සමබන්ධයෙන් ප්‍රකාශ සටහන් කිරීම සඳහා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අයට 2019.08.16 දින පැය 09.30 ට මෙම කොට්ඨාශයේ පෙනී සිටීමට දන්වා අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 109(6) යටතේ දන්වන ලදී. එහිදී ඇය විසින් 2019.09.15 දිනැතිව ලිපියක් යොමු කරමින් ප්‍රකාශය ලබාදීම සඳහා එදින සිට දින 14 ක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

එබැවින් නැවතත් 2019.08.29 දින ප්‍රකාශය ලබාදීම සඳහා පැමිණීමට දන්වා අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 109(6) යටතේ කරන ලද දැන්වීම අනුව ඇය එදින ස්ථානයට පැමිණ පෙනී සිටින ලදී. නමුත් ඇයට එදින ප්‍රකාශ ලබා දීමට ලේඛන ලබා ගැනීමට නොහැකිවූ බැවින් 2019.09.12 දින පැය 09.00 ට මෙම කොට්ඨාසයේ පෙනී සිට ප්‍රකාශය ලබා දීමට කටයුතු කරන බවට ප්‍රකාශයක් ලබාදෙන ලදී.

නැවතත් 2019.09.11 දින ඇය විසින් ලිපියක් සමග වෛද්‍ය වාර්තා කිහිපයක් යොමු කරමින් ඇය නවලෝක රෝහලට ඇතුලත්ව සැත්කමකට භාජනයවී ඇති බැවින් ප්‍රකාශය ලබාදීම සඳහා සති 4- 6 පමණ ලබා දෙන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව 2019.10.17 දින පැමිණෙන ලෙසට දැන්වීමක් භාරදීමට 2019.10.04 දින ක්‍රියා කල නමුත් නිවස වසා තිබූ බැවින් එම දැන්වීම භාරදීමට නොහැකි විය. ඒ අනුව 2019.10.17 දින ප්‍රකාශය ලබාදීම සඳහා මෙම කොට්ඨාශයේ පෙනී සිටීමට අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 109(6) යටතේ ලියාපදිංචි තැපැල් මගින් දැන්වීම් යොමු කර ඇත. මෙයට අදාලව 2019.10.17 වන දින පුනායා ප්‍රියන්ංජි මැණිකේ එඩ්වඩ්ස් යන අය ප්‍රකාශයක් ලබාදීම සඳහා නොපැමිණි අතර එයට හේතු ලෙස තවදුරටත් අසනීපයෙන් පසුවන බව දන්වා 2019.10.16 වන දින මෙම කොට්ඨාසය වෙත ලිපියක් අතින් ගෙනවිත් භාරදී ඇත.

රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් යන අයගේ ප්‍රකාශ ලබා ගැනීම සඳහාද 2019.10.09 දින පැමිණෙන ලෙසට දන්වා දැන්වීමක් භාරදීමට 2019.10.04 දින ක්‍රියා කල නමුත් නිවස වසා තිබූ බැවින් එම දැන්වීම භාරදීමට නොහැකි විය. ඒ අනුව 2019.10.09 දින මෙම කොට්ඨාශයේ පෙනී සිටීමට දන්වා අ.න.වි.ස 109(6) යටතේ දැන්වීමක් ලියාපදිංචි තැපැල් මගින් යොමු කර ඇතත් එදිනද ඔහු ප්‍රකාශ ලබාදීමට පැමිණ නැත.

ජයකොඩි ආරච්චිලාගේ දිප්තිකා හසන්ජි යන අයගේ ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා 2019.10.10 දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත පැමිණීමට දන්වා අ.න.වි.ස 109(6) යටතේ දැන්වීමක් ලියාපදිංචි තැපැල් මගින් ඇය පදිංචි ලිපිනය වශයෙන් ලබාදී ඇති අංක 57/2බී, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ ලිපිනයට යොමු කරන ලදී. නමුත් ඇයද ප්‍රකාශය ලබාදීම සඳහා මෙම කොට්ඨාසයේ පෙනී සිට නොමැති බව ගරු අධිකරණය වෙත ගෞරවයෙන් වාර්තා කරමි.

21. ඉහත කරුණු අනුව මෙම රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස්, පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් හා ජයකොඩි ආරච්චිලාගේ දිප්තිකා හසන්ජි යන අය විවිධ හේතු දක්වමින් ප්‍රකාශ ලබාදීම මගහරිමින් විමර්ශනයට සහාය නොදක්වන බව පෙනීයයි. ඒ අනුව මෙම විමර්ශනයට අදාලව මොවුන්ගේ නැවත ප්‍රකාශ සටහන් කිරීම අත්‍යාවශ්‍යව ඇති බැවින් 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ 124 වන වගන්තිය ප්‍රකාරය පැවරී ඇති බලතල ප්‍රකාරව පහත නම් සඳහන් තැනැත්තන් තිදෙනාට අධිකරණය ඉදිරියේ පෙනී සිට මෙම විමර්ශනයට අදාලව ප්‍රකාශයක් ලබා දීමට නියෝගයක් නිකුත් කිරීම සඳහා නොතීසි නිකුත් කරන ලෙසට ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ප්‍රකාශ ලබාගත යුතු පුද්ගලයින්ගේ විස්තර

I. රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස්, අංක 57/2බී, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ.
II. පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස්, අංක 57/2බී, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ.
III. ජයකොඩි ආරච්චිලාගේ දිප්තිකා හසන්ජි, අංක 57/2බී, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ.

22. ඉහත කරුණු අනුව මෙම රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය ප්‍රකාශ ලබාදීම මගහරිමින් විමර්ශනයට සහාය නොදක්වමින් සිටින බවට පෙනී යන අතර මෙම තත්වය මත ඔවුන් විදේශගතවීමටද ඉඩ ඇති බව පෙනී යයි. එමගින් ජාත්‍යන්තර වශයෙන් සිදුකරන ලද අපරාධයකට අදාලව සිදුකරන විමර්ශන කටයුතු සඳහා බාධාවක් විය හැකි බැවින් 1988 අංක 11 දරණ පනතින් සංශෝධිත 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 124 වන වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව ඔවුන්ගේ විදේශ ගමන් තහනම් කිරීම සඳහා ආගමන විගමන පාලකවරයා වෙත නියෝගයක් නිකුත් කරන මෙන් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

විදේශ ගමන් තහනම්කල යුතු පුද්ගලයින්ගේ විස්තර

1. සම්පූර්ණනම - රියන්සිමහේෂ් කුමාර එඩ්වඩ්ස්
   ජාතික හැඳුනුම්පත් අංකය - 611270747 V
   ලිපිනය -57/2බී, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ

2. සම්පූර්ණ නම - පුනාා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස්
   ජාතික හැඳුනුම්පත් අංකය - 807004492V
   ලිපිනය - 57/2බී, රේල්වේ ඇවන්‍යු, නුගේගොඩ

23. මෙහි ඉදිරි විමර්ශන කටයුතු සඳහා සූර්යා ඉන්ටර් නැෂනල් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම සංස්ථාගත කර ඇති ලියාපදංචි ලිපිනය වන නො. 16/ඒ2, මොනාක් රෙසිඩන්සීස්, ගාලු පාර, කොල්ලුපිටිය. මහල් නිවාස සංකීරණයේ දේපල මිලදී ගැනීට අදාල කරුණු අනාවරණය කර ගැනීම සඳහා කොමර්ෂල් බැංකුව යූනියන් පෙදෙස ශාඛාවේ කළමණාකරු වෙත හා HSBC –Premier Center ශාඛාවේ කළමණාකරු වෙත පහත සඳහන් ලේඛණ සමග ප්‍රකාශයක් ලබා දීම සඳහා අධිකරණ නියෝග ලබා ගත යුතුව ඇත.

කොමර්ෂල් බැංකුව යූනියන් පෙදෙස ශාඛවේ කළමණාකරුගෙන් ලබාගත යුතු ලේඛණ

- Talos Consulting (Pvt)Ltd (පීවී 109455)නමින් ඔබ බැංකු ශාඛාවේ පවත්වා ගෙන යන අංක 1480045656 දරණ ගිණුම විවෘත කිරිමට අදාල අයදුම්පත,
- එම ගිණුමේ මැන්ඩේඩ් පත්‍රය
- අත්සන් කාඩ්පත,
- ගනු දෙනු කිරිමට බලයලත් පුද්ගලයින් ගේ නම ලිපිනය හා ජාතික හැඳුනුම්පතේ පිටපත
- මෙම ගිනුමට විදේශ මුදල් ලැබීමට අදාලව Swift පණිවුඩ
- බැංකු අණකර නිකුත් කිරිමට අදාල අයදුම්පත හා බැංකු අණකර පිටපත්
- Fund Transfer වලට අදාල ඉල්ලුම් ලිපිය හා ඊට අදාල අනෙකුත් ලේඛණ
- ගනු දෙනු සිදු කිරිමට අදාල හර පත් හා බැර පත්
- ගිණුමට මුදල් බැරවිමට අදාල සියළු ලේඛණ
- ගිණුම් විවෘත කල දින සිට අද දින දක්වා ගිණුම් ප්‍රකාශය සමග අනුසාංගික ලේඛණ සමග කළමණාකරුගේ ප්‍රකාශයක්

HSBC –Premier Center ශාඛාවේ කළමණාකරුගෙන් ලබා ගත යුතු ලේඛණ

- Kenneth Gordon Mcalpine(702044081V) නමින් ඔබ බැංකු ශාඛාවේ පවත්වා ගෙන යන අංක 007-083645-001 දරණ ගිණුමහි මැන්ඩේඩ් පත්‍රය
- Fund Transfer මාර්ගයෙන් කොමර්ෂල් බැංකුව යූනියන් පෙදෙස ශාඛාවේ 1480045656 දරණ ගිණුමෙන් 2016.02.11 දින හෝ ආසන්න දිනක රු. 42,858,000.00 ක මුදලක් බැරවිමට අදාල ගිණුම් ප්‍රකාශය හා ඊට අදාල වෙනවත් ලේඛණ
- කොමර්ෂල් බැංකුව යූනියන් පෙදෙස ශාඛාවේ 1480045656 දරණ ගිණුම සමග වෙනත් ගනු දෙනු සිදු කර ඇත්නම් ඊට අදාල අනුසාංගික ලේඛණ සමග කළමණාකරුගේ ප්‍රකාශයක්

24. විමර්ශණ කටයුතු ආරම්භ කිරීමෙන් පසුව සංස්ථාගතකර ඇති පහත සමාගම් නමින් බැංකු ගිණුම් විවෘතකර එමගින් ගනු දෙනු සිදුකරන බව අනාවරණය වි ඇත. ඒ අනුව පහත සමාගම් නමින් හා එම සමාගම්වල පහත සඳහන් අධ්‍යාක්ෂවරුන් විසින් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බැංකු හා මූල්‍ය ආයතන වල සිදු කරන ගනු දෙනු හා සිදුකර ඇති ගනු දෙනු සම්බන්ධයෙන් පහත සඳහන් ලේඛණ සමග බැංකු හා මූල්‍ය ආයතන කළමණාකාරවරුන්ගේ ප්‍රකාශ ලබා ගත යුතුව ඇත.

විස්තර ලබා ගත යුතු අධ්‍යාක්ෂවරුන්ගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංක :-

1. රියන්සි මහේෂ් කුමාර් එඩ්වඩ්ස් :- 611270747 වී
2. පුනාා ප්‍රියන්ංජි මැණිකේ එඩ්වඩ්ස් :- 807004492 වී
3. ජයකොඩි ආරච්චිලාගේ දිප්තිකා හසන්ජි :- 878454081 වී
4. එස්සැල්ල පතිරාජගේ මේරි බැසිලිකා :- 566331217 වී
5. නිෂිත සුදිප් රූපසිංහ :- 791932637 වී

සමාගමේ නම හා ලියාපදිංචි අංකය :-

1. එඩ්වඩ්ස් ප්ලාන්ටේෂන් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 62079
2. ග්‍රීන්ඩ් ෆීල්ඩ් කන්සල්ටන්සි සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 88548
3. ද මැන්ෂන් කැන්ඩි ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 85730
4. කළම්බු ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 108439
5. බොන්ඩ් ස්ට්‍රීට් මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 118621
6. ආශා මැන්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 116259
7. ට්‍රැම්වෙල් කන්සල්ටන්සි සර්විස් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 118593
8. හයිරයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 108440
9. සූරියා ඉන්ටර් නැෂනල් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 111792
10. එඩ්වඩ්ස් එස්ටේට්ස් ප්ලාන්ටේෂන් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 62160
11. එඩ්වඩ්ස් ඉන්වෙස්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 63280
12. ට්‍රැඩිෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් :- පීවී 79191
13. රෝයල් ටර්ෆ් ක්ලබ් :- ජීඒ 3072
14. අත්වැල පදනම :- ජීඒ 2770

විස්තර ලබාගත යුතු ලියා පදිංචි මූල්‍ය ආයතන.

| | | | |
|---|---|---|---|
| 1. | අමානා බැන්ක් පීඑල්සී | 2. | ඇක්සිස් බැන්ක් ලිමිටඩ් |
| 3. | ලංකා බැංකුව | 4. | කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් |
| 5. | සිටි බැන්ක් එන්ඒ | 6. | ඩොයිෂ් බැන්ක් ඒ.ජී |
| 7. | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 8. | ඩී.එෆ්.සී.සී බැන්ක් පීඑල්සී |
| 9. | අයි.සී.අයි.සී.අයි බැන්ක් ලිමිටඩ් | 10. | හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී |
| 11. | නේෂන් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී | 12. | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී |
| 13. | පැන් ඒෂියා බැන්කින් කොපරේෂන් පීඑල්සී | 14. | හබිබ් බැන්ක් ලිමිටඩ් |
| 15. | මහජන බැංකුව | 16. | ඉන්දියානු බැන්ක් |
| 17. | ඉන්දියන් ඔවර්සීස් බැන්ක් | 18. | සම්පත් බැන්ක් පීඑල්සී |
| 19. | එම්.සී.බී බැන්ක් ලිමිටඩ් | 20. | ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැන්ක් |
| 21. | පබ්ලික් බැන්ක් බර්හාර්ඩ් | 22. | ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් |
| 23. | සෙලාන් බැන්ක් පිඑල්සී | 24. | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව |
| 25. | ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා | 26. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 27. | යූනියන් බැන්ක් ඔෆ් කළඹ පිඑල්සී | 28. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 29. | ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් | 30. | ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ් |
| 31. | සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී | 32. | අබාන්ස් ෆිනෑන්ස් පි.එල්.සී |
| 33. | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 34. | ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සි |
| 35. | අලියාන්ස් ෆිනෑන්ස් කෝ පි.එල්.සි | 36. | ඒෂියා ඇසට් ෆිනෑන්ස් පි.එල්.සි |
| 37. | ආර්පිකෝ ෆිනෑන්ස් පි.එල්.සි | 38. | ඇසෝසියේට් මෝටර් ෆිනෑන්ස් පි.එල්.සි |
| 39. | බිම්පුත් ෆිනෑන්ස් පි.එල්.සි | 40. | බී.ආර්.ඒ.සි ලංකා ෆිනෑන්ස් පි.එල්.සි |
| 41. | සෙන්ට්‍රල් ෆිනෑන්ස් කෝ පි.එල්.සි | 42. | කලම්බු ට්‍රස්ට් ෆිනෑන්ස් පි.එල්.සි |
| 43. | කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සි | 44. | කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සි |
| 45. | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ් | 46. | කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 47. | අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් | 48. | එච්.එන්.බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 49. | ඊ.ටී.අයි ෆිනෑන්ස් ලිමිටඩ් | 50. | සිටිසන් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පි.එල්.සි |
| 51. | එල්.බී ෆිනෑන්ස් පි.එල්.සි | 52. | එල්.ඕ.එල්.සී ෆිනෑන්ස් පි.එල්.සි |
| 53. | මර්චන්ට් බෑංක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සි | 54. | මර්කන් ටයිල් ඉන්වෙස්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සි |
| 55. | නේෂන් ලංකා ෆිනෑන්ස් පි.එල්.සි | 56. | මල්ටි ෆිනෑන්ස් පි.එල්.සි, |
| 57. | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සි | 58. | ඔරියන්ට් ෆිනෑන්ස් පි.එල්.සි |
| 59. | සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පි.එල්.සි | 60. | සියපත ෆිනෑන්ස් පි.එල්.සි |
| 61. | ස්වර්ණමහල් ෆිනෑන්ස් සර්විස් පි.එල්.සි | 62. | ද ෆිනෑන්ස් කෝ පි.එල්.සි |
| 63. | ටී.කේ.එස් ෆිනෑන්ස් ලිමිටඩ් | 64. | ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්මන්ට් පි.එල්.සි |

65. යූ.බී ෆිනෑන්ස් කෝ ලිමිටඩ්
66. වැලිබල් ෆිනෑන්ස් පී.එල්.සී
67. සිංහපුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී
68. සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්
69. සිංගර් ෆිනෑන්ස් ලංකා පී.එල්.සී
70. සෙන්කඩගල ෆිනෑන්ස් පී.එල්.සී
71. සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්
72. ට්‍රේඩ් ෆිනෑන්ස් ලිමිටඩ් (72. ටිවඩ පිපිය් ෆිනෑන්ස් ලිමිටඩ්)
73. ප්‍රයිම් ෆිනෑන්ස් පී.එල්.සී
74. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී
75. මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්

ඉහත මූල්‍ය ආයතන වලින් ලබාගත යුතු විස්තර:-

1. ඉහත සඳහන් පුද්ගලයන් හා සමාගම් විසින් එම බැංකුවේ ආරම්භ කර ඇති සියලුම බැංකු ගිණුම් වලට අදාල මැන්ඩේට් පත්‍ර වල සහතික පිටපත්.
2. අත්සන් පත්‍රයේ සහතික පිටපත්.
3. ගිණුම් හිමියාගේ විස්තර.
4. ගිණුම් හිමියා වෙනුවෙන් අරමුදල් ලැබීම හා මාරු කිරීම් සම්බන්ධ විස්තර.
5. ගණුදෙනු කිරීමට බලය ලබාදී ඇති පුද්ගලයන්.
6. ගිණුම විවෘත කල දින සිට මේ දක්වා ගිණුම් ප්‍රකාශ
7. මුදල් භර, බැර හා මාරු කිරීමට අදාල පිසිට්පත් වල සහතික පිටපත්.
8. අදාල ගිණුම් යටතේ විදේශීය රටකින් මුදල් තැම්පත් කිරීමක් හෝ විදේශීය රටකට මුදල් මාරු කිරීම් සම්බන්ධ විස්තර, තැම්පතු සම්බන්ධ විස්තර හා ලේඛන (SWIFT පණිවිඩ ඇතුලුව)
9. මුදල් අණකර නිකුත් කිරීමට අදාල ඉල්ලුම් පත්‍රය හා මුදල් අණකරයේ සහතික පිටපත්
10. අදාල පුද්ගලයන් හෝ සමාගම් විසින් ලබාගෙන ඇති ණය ලබා ගැනීම් හා ණය ගෙවීම් සම්බන්ධ විස්තර.
11. අදාල පුද්ගලයන් හෝ සමාගම් විසින් තැම්පත් කර ඇති ස්ථාවර තැම්පතු සම්බන්ධ විස්තර.
12. අදාල පුද්ගලයන් හෝ සමාගම් විසින් ලබාගෙන ඇති ආරක්ශිත සේප්පු හා වෙනත් පහසුකම් සම්බන්ධ විස්තර.
13. විමර්ශනයේදී හෙළිවන අනෙකුත් අනුශාංගික කරුණු මත්තේ පරීක්ෂණ සිදුකිරීමට අවශ්‍ය ලේඛන.
11. ඉහත විස්තර හා ඊට අදාල අනුශාංගික කරුණු සමග බැංකු හා මූල්‍ය ආයතන වල කළමණාකාරවරුන්ගේ ප්‍රකාශයන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ විමර්ශන ඒකක 04 හි ස්ථානාධිපති වෙත හෝ ඔහුගේ නියෝජිතයෙකු වෙත දින 14 ක් තුල ලබාදීමට 1988 අංක 11 දරණ පනතින් සංශෝධිත 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 124 වන වගන්තිය සහ සාක්ෂි ආඥා පනතේ 90ඇ(1) වගන්තිය අනුව ගරු අධිකරණය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම සඳහන් ක්‍රියාපදිංචි බැංකු හා මූල්‍ය ආයතනවල කළමණාකරුවන් වෙත නියෝග නිකුත් කරන ලෙස ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

25. ඉහත කරුණු වලට අදාලව ඉදිරි විමර්ශන සිදු කර ප්‍රගතිය වාර්තා කිරීම සඳහා ඉදිරි දිනයක් ලබා දෙන ලෙස ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ස්ථානාධිපති,
විමර්ශන ඒකක 04,
මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය,
කොළඹ01.
2019.10.21

**ආර්. ඒ. සී. පී. රණසිංහ**
**ප්‍රධාන පොලිස් පරීක්ෂක**
**ස්ථානාධිපති ඒකක 04**
**මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය**
**කොළඹ 01.**

(ඇමුණුම 1)

<u>විමර්ශනයට අදාලව සටහන් කරන ලද සාක්ෂි සාරාංශය.</u>

1. විජේතුංගමුදියන්සේලාගේ රංජිත් ප්‍රේමතිලක, අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් මහනුවර.
තමන් සහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් වශයෙන් 2011.09.01 දින සිට සේවය කරන අතර නිතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බී.කරල්ලියද්ද විසින් ලියා සහතික කල 2014.07.25 දින 10265 දරණ ඔප්පුව A 298/253 හි 2014.07.25 දිනද 2014.07.16 දින ලියා සහතික කල අංක 10266 දරණ ඔප්පුව A293/250 හි 2014.07.28 දිනද 2014.01.08 දින ලියා සහතික කල අංක 10059 දරණ ඔප්පුව D37/12 හි 2014.02.03 දිනද නිතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ටී.බී.එච්.දූනුවිල විසින් ලියා සහතික කල 2013.02.20 දින අංක 3638 දරණ ඔප්පුව Q04/50 හි 2013.03.06 දිනද ලියා පදිංචි කර ඇති බවත් මෙම ඔප්පු ලියාපදිංචි කරන අවස්ථාවේ දේපල ගැනුම්කාරිය විසින් අන්තිම කැමති පත්‍රයක් මගින් විදේශිකයෙකුට පවරා ඇති බව නොදැන සිටි බවත් එම පැවරිම 2014 අංක 38 දරණ ඉඩම් සන්තකය පැවරිම සීමා කිරීමේ පනතේ 2 වන වගන්තිය අනුව තහනම් වන බවත් ප්‍රකාශ කර ඇත..

2. පරකැටිය මනන්නලාගේ සුනිල් රත්නායක, අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්, නුවරඑළිය. තමන් නුවරඑළිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් ලෙස 2013.08.06 දින සිට සේවය කරන බවත් නිතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බී.කරල්ලියද්ද විසින් ලියා සහතික කල 2013.12.24 දින අංක 10042 දරණ ඔප්පුව A145/42 හි 2014.01.06 දින ලියාපදිංචි කර ඇති බවත් 2014.10.07 දින අංක 10341 දරණ ඔප්පුව A90/248 හි 2014.10.20 දිනද 10343 දරණ ඔප්පුව A83/255 හිලියාපදිංචි කර ඇති බවත් මෙම ඔප්පු ලියාපදිංචිය සඳහා භාර දෙන අවස්ථාවේ එම ඔප්පුවල ගැනුම්කාරිය විසින් මෙම දේපල විදේශිකයෙකුට අයිති වන ආකාරයෙන් අන්තිම කැමති පත්‍රයක් අත්සන් කර ඇති බව නොදැන සිටි බවත් එවැනි පැවරීම් 2014 අංක 38 දරණ ඉඩම් සන්තකය පැවරිම සීමා කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ තහනම් බවද අනාවරණය කර ඇත.

3. කිඹියගේ දුලානි හේමමාලි කීර්තිසිංහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, ගාල්ල. ඉඩම් රෙජිස්ට්‍රාර් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වශයෙන් 2008.08.30 දින සිට ගාල්ල කාර්යාලයේ සේවය කරන බවත් නිතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස් චන්දන එස්.පී.ගොඩකන්ද විසින් ලියාසහතික කල අංක 1178 දරණ ඔප්පුව තම කාර්යාලයේ S48/136 හි ලියාපදිංචි කර ඇති බවත් නිතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බී.කරල්ලියද්ද විසින් ලියා සහතික කල 2014.01.20 දින අංක 10068 දරණ ඔප්පුව Q72/38 හි ලියාපදිංචි කර ඇති බවත් 2014.07.30 දින අංක 10274 දරණ ඔප්පුව 2014.07.30 දින අංක 10274 දරණ ඔප්පුව S49/24 හි ලියාපදිංචි කර ඇති බවත් මෙම ඔප්පු ලියාපදිංචිය සඳහා භාර දෙන අවස්ථාවේ එම ඔප්පුවල ගැනුම්කාරිය විසින් මෙම දේපල විදේශිකයෙකුට අන්තිම කැමති පත්‍රයක් මගින් පවරා ඇති බව නොදැනසිටි බවත් එවැනි පැවරීම් 2014 අංක 38 දරණ ඉඩම් (සන්තකය පැවරිම සීමා කිරීමේ) පනතේ 2 වන වගන්තිය යටතේ තහනම් බවත් අනාවරණය කර ඇත.

4. දුලාන් සුභාවන දසනායක, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය, රත්දොඹෙ, බලපිටිය
2013 වසරේ සිට අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් ලෙස සේවය කරන බවත්, නාතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ටී.බී.එච් දූනුවිල විසින් ලියා සහතික කල 2013.08.04 වන දින 3659 දරණ ඔප්පුව එම කාර්යාලයේ D 39/04 හි ලියාපදිංචි කර ඇති බවත්, එම ඔප්පුවේ ගැණුම්කාරිය විසින් අත්නිම කැමති පත්‍රයක් මගින් මෙම දේපල විදේශිකයෙකුට පවරා ඇත්නම් එය 2014 අංක 38 දරණ ඉඩම් (සන්තකය පැවරිම සීමාකිරිමේ ) පනතේ 2 වගන්තිය යටතේ තහනම් බවත් අනාවරණය කර ඇත.

5. හේරත් මුදියන්සේලාගේ සුමිත්‍රා නන්දනි කුමාරි, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, අනුරාධපුර.
2011 අප්‍රේල් මස අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් ලෙස සේවයට පැමිණ 2015 දෙසැම්බර් සිට ඉඩම් රෙජිස්ට්‍රාර් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වශයෙන් සේවය කරන බවත්, නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් **P.S.R** ප්‍රේමලාල් විසින් ලියා සහතික කල 2014.01.30 දින අංක 032 දරණ ඔප්පුව **F 02/166** හි ලියාපදිංචි කර ඇති බවත්, එම ඔප්පුවේ ගැණුම්කාරිය විසින් අන්තිම කැමති පත්‍රයක් මගින් මෙම දේපල විදේශිකයෙකුට පවරා ඇත්නම් එය 2014 අංක 38 ඉඩම් (සන්තකය පැවරිම සිමාකිරිමේ) පනතේ 02 වගන්තිය යටතේ තහනම් බවත් අනාවරණය කර ඇත.

6. හේරත් මුදියන්සේලාගේ සමන් කුමාර, අංක 167, ඉපලෝගම, තලාකොලවැව පාර, මහව
තමා 2011.04.04 දින සිට ත්‍රිකුණාමලය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඉඩම් රෙජිස්ට්‍රාර් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වශයෙන් කටයුතු කරන බවත්, නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් **R.M.B** කරල්ලියද්ද විසින් ලියා

සහතික කරන ලද අංක 10128 දරණ ඔප්පුව තම කාර්යාලයේ පිළිවෙලින් A119/63, A119/65, A119/64, A119/61, A119/62 දරණ පත්ඉරු වලද අංක 10129 දරණ ඔප්පුව A119/66 හා A119/67 දරණ පත්ඉරු වලද අංක 10130 දරණ ඔප්පුA119/71, A119/70, A119/72 හා A119/69 දරණ පත්ඉරු වලද ලියාපදිංචි කර ඇති බවත්, එම ඔප්පුවේ ගැණුම්කාරිය විසින් අන්තිම කැමති පත්‍රයක් මගින් මෙම දේපල විදේශිකයෙකුට පවරා ඇත්නම් එය 2014 අංක 38 දරණ ඉඩම් (සන්තකය පැවරීම සීමාකිරීමේ) පනතේ 02 වගන්තිය යටතේ තහනම් බවත් අනාවරණය කර ඇත.

7. ශියැන්ඩා ඇන්ටනෙට් විජේතුංග, නො 639/5, ගුණවර්ධන මාවත, පිටකෝට්ටේ
නීතිඥවරියක ලෙස නිත්‍යා පාට්නර්ස් නීතිඥ සමාගමේ සේවය කරන බවත්, තම සමාගමේ සේවා දායකයෙකු වන රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් විසින් ඔහුගේ බිරිඳගේ නමින් මිලදී ගත් ආසිරි රෝහලට අයත් කොළඹ 07, හෝර්ටන් පෙදෙස පිහිටි දේපල සඳහා තමන් සේවය කරන නීතිඥ සමාගමේ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් සමාධි තරංගා ගජවීර විසින් 2015.07.09 දින ලියා සහතික කල අංක 1031 දරන ඔප්පුවේ දෙවන සාක්ෂිකරු ලෙස අත්සන් කල බවත් විකුණුම්කරුවන් හා නීතිඥවරිය තමන් හොඳින් හඳුනන බවත් ප්‍රකාශ කර ඇත.

8. පතිරගේ තුෂාරි තරංගා ගජනායක, 172/ඒ ගොඩකන්ද පාර,කරාපිටිය, ගාල්ල.
තමන් නීතිඥවරියක වශයෙන් නිත්‍යා පාට්නර්ස් සමාගමේ නීතිඥවරියක වශයෙන් කටයුතු කරන බවත්, තම සමාගමේ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් සමාධි තරංගා ගජවීර විසින් ලියා සහතික කල 2005.07.09 වන දින අංක 1031 දරණ ඔප්පුයේ පළමු සාක්ෂිකාරිය ලෙස තමන් අත්සන් කල බවත් මෙම ඔප්පුව මගින් ආසිරි හොස්පිට්ල් සමාගමට අයත් දේපලක් පූනායා ප්‍රියංජි මැණිකේ එඩ්වඩ්ස් විසින් මිලදී ගැනිමට අදාලව ලියා සහතින කල බවත් ප්‍රකාශ කර ඇත.

9. පුල්ලේපෙරුමගේ මාලනි පෙරේරා, නො 619/47, දෙවන පියවර, අනුරාධපුරය
තමන්ට අයත් අනුරාධපුර බලංකුලම පිහිටි මහවෙල නැමැති දේපල විකිණිම සඳහා දැන්වීම් පලකිරිමෙන් අනතුරුව මිරිසවැටිය විහාරස්ථානයේ පොඩි හාමුදුරුවන් එම දේපල මිලදී ගැනිම සඳහා ඉදිරිපත් වූ බවත්, ඒ අනුව නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් පී.එස්.ආර් ප්‍රේමලාල් විසින් ලියා සහතික කල 2014.01.30 දින අංක 32 දරණ ඔප්පුව මගින් රුපියල් ලක්ෂ 45 ට විකුණු බවත් ඔප්පුවේ ගැණුම්කරු ලෙස සඳහන් පූනායා ප්‍රියංජි මැණිකේ එඩ්වඩ්ස් යන අය නොහඳුනන බවත් ප්‍රකාශ කරමින් අදාල මුදල මිරිසවැටිය විහාරස්ථානයේ පොඩි හාමුදුරුවන් විසින් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත.

10. විරතුංග ආරච්චිලාගේ රාජිත විජේතුංග, නො 619/47 දෙවන පියවර අනුරාධපුරය,
තම මව වන පුල්ලෙපෙරුමගේ මාලනි පෙරේරා යන අයට අයත්ව තිබූ අනුරාධපුර බුලංකුලම පිහිටි මහවෙල නැමැති දේපල මිරිසවැටිය විහාරස්ථානයේ පොඩි හාමුදුරුවන් වෙත විකිණිමට අදාලව නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් පී.එස්.ආර් ප්‍රේමලාල් විසින් ලියා සහතික කල 2014.01.30 දින අංක 32 දරණ ඔප්පුවේ පළමු සාක්ෂිකරු ලෙස අතසන් කල බවත්, ඔප්පුවේ ගැණුම්කරු ලෙස සඳහන් පූනායා ප්‍රියංජි මැණිකේ එඩ්වඩ්ස් යන අය නොහඳුනන බවත්, ප්‍රකාශ කරමින් අදාල මුදල තමන් ඉදිරිපිටදී මිරිසවැටිය විහාරස්ථානයේ පොඩිහාමුදුරුවන් විසින් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත.

11. ඌරුමුත්තගමගේ කිර්තිරත්න, අංක 135, තිසා වැව බටහිර, පන්ඩුලගම, අනුරාධපුර
තමන් වන සංරක්ෂන දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා භාරකරු වශයෙන් තිසාවැව සංචාරක බංගලාවේ සේවය කරන බවත්, අසල පිහිටි මිරිසවැටිය පන්සලේ රථනසාර හිමියන් තමන් වසර 12 ක පමණ සිට හඳුනනන බවත්, හාමුදුරුවන්ගේ දැනුම්දිම අනුව හාමුදුරුවන්ගේ ඥාතියෙකු වෙත මිලදී ගත් ඉඩමකට අදාලව නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් පී.එස්.ආර් ප්‍රේමලාල් මහතාගේ කාර්යාලයේදී ඔප්පුවක සාක්ෂිකරු ලෙස අත්සන් කල බවත්, අනුරාධපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගන්නා ලද නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් පී.එස්.ආර් ප්‍රේමලාල් විසින් ලියා සහති කල 2014.01.30 දින අංක 32 දරණ ඔප්පුවේ සහතික පිටපත ඉදිරිපත් කිරිමෙන් පසුව එහි දෙවන සාක්ෂිකරු ලෙස ඇති අත්සන තමාගේ අත්සන බවත්, විකුණුකම්කරුවන් තමා නොහඳුනන බවත් ප්‍රකාශ කර ඇත.

12. පියෝරිස් සමරසිංහගේ රෝහණ ප්රේමලාල්, (නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්) අංක 2, පමු පටුමග, විද්‍යාල මාවත, අනුරාධපුර
අනුරාධපුර මහාධිකරණ කාර්යාලයේ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙක් වශයෙන් කටයුතු කිරිම සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇති බනවත් වසර 30 ක පමණ සිට හඳුනන මිරිසවැටිය විහාරස්ථානයේ රථනසාර හාමුදුරුවන් පූනායා ප්‍රියංජි මැණිකේ එඩ්වඩ්ස් යන අය වෙනුවෙන් ඉඩමක් මිලදී ගැනිමට අදාලව 2014.01.30 දින අංක 32 දරණ ඔප්පුව ලියා සහතික කල බවත්, ගැණුම්කාරිය තමන් හමුනොවූ බවත් විකුණුම්කාරිය ඔප්පුවට

අත්සන් කිරීමෙන් අනතුරුව අදාල මුදල රතනසාර හිමියන් විසින් තමා ඉදිරිපිටදී විකුණුම්කාරිය වෙත ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත.

**13.** පිච්චපිලෙ මහේෂ්වරන්, අංක 12, ග්ලේන්ෆෝල් පාර, නුවරඑළිය.
තමන්ට අයත් නුවරඑළිය යුනික්විව් පාරේ පිහිටි ඉඩමක් විකිණීමට තීරණය කර ගැණුම්කරුවෙකු ලෙස ඉදිරිපත් වූ මහනුවර පදිංචි වෛද්‍ය නෙවිල් යන අය අවස්ථා කිහිපයක් පැමිණ විමසා සිටි බවත් ඒ අනුව රුපියල් මිලියන 10 කට එම ඉඩම විකිණීමට අදාලව මහනුවර කොළඹ වීදියේ පිහිටි නීතිඥ ආර්.එම්.බී කරල්ලියද්ද විසින් ලියා සහතික කල 2014.10.07 දිනඅංක 10341 දරණ ඔප්පුවට අත්සන් කල බවත්, ඒ අනුව වෛද්‍ය නෙවිල් ද සිල්වා විසින් ඊට අදාල මුදල සම්පත් බැංකුවේ 006876 දරණ චෙක්පත මගින් ලබාදුන් බවත්, ඔප්පුවේ සදහන් ගැණුම්කාරිය වන පුනායා ප්‍රියංජි මැණිකේ එඩ්වඩ්ස් යන අය සාක්ෂිකරුවන් නොහඳුනන බවත් ප්‍රකාශ කර ඇත.

**14.** තනුජ් ද අල්විස් ගුණවර්ධන, නො 55, ලයනල් එදිරිසිංහ මාවත, කිරුලපන, කොළඹ 05.
තමන්ට අයත් මහනුවර හාරගම පිහිටි ඉඩමේ නිවසක් ඉදිකිරීමෙන් අනතුරුව මව අසනීප හේතුවෙන් එම දේපල විකණීමට තීරණය කර තැරැව්කරුවෙකු වන ඉක්‍රම් ඔඩෙයාර් මාර්ගයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් යන අයට රුපියල් මිලියන 70 කට විකිණීමට එකග වි නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ටී.බී.එච් දුනුවිල විසින් ලියා සහතික කල 2013.02.20 දින අංක 3638 දරණ ඔප්පුවේ අත්සන් කල බවත් මේ සදහා අත්තිකාරම් වශයෙන් රුපියල් මිලියන 03 ක චෙක්පතක්ද, මුදලින් රුපියල් මිලියන 35 ක් හා රුපියල් මිලියන 32 ක් ලබාදුන් බවට ප්‍රකාශ කර ඇත.
ඔප්පුවේ ගැණුම්කරු ලෙස සදහන් පුනායා ප්‍රියංජි මැණිකේ එඩ්වඩ්ස් යන අය රියන්සි මහේස් කුමාර් එඩ්වඩ්ස්ගේ බිරිද බවත් තමා හදුනන බවත්, සාක්ෂිකරුවන් නොහදුනන බවත් ප්‍රකාශ කර ඇත.

**15.** දේවින්ද සුරේන්ද්‍රනාත් සේනානායක, අංක 104, ඩී.එස් සේනානායක මාවත, කොළඹ 08.
තමන්ටඅයත් නුවරඑළිය යුනික් විව් අංක 5/5 දරණ ස්ථනයේ පිහිටි පර්චස් 30.60 වන ඉඩම විකිණීම සදහා තීරණය කර මහනුවර පදිංචි වෛද්‍යවරයෙක් වන නෙවිල් ද සිල්වා යන ඉදිරිපත් වි එම දේපල රුපියල් මිලියන 40 කට මිලදී ගැනීමට ඉදිරිපත් වීම හේතුවෙන් තමා අසනීප තත්වයෙන් සිටින බැවින් බොරැල්ල පිහිටි නිවසට නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බී කරල්ලියද්ද හා වෛද්‍ය ලුවිස්දූර නෙවිල් ඇඩ්රික් ද සිල්වා යන අය පැමිණි බවත් ඒ අනුව 2014.10.07 දින 10258 දරණ විකුණුම් ගිවිසුම අත්සන් කල බවත්, එදින අත්තිකාරමක් ලෙස රුපියල් මිලියන 05 කට අදාල හැටන් නැෂනල් බැංකුවේ අංක 10258 දරණ චෙක්පත ලබාදුන් බවත් ඉන් මාස 03 කට පමණ පසුව එනම්, 2014.10.08 දින තම නිවසට පැමිණි ඉහත නොතාරිස්වරයා හා වෛද්‍යවරයා විසින් 10343 දරණ විකුණුම්කරයට අත්සන් ලබාගත් බවත් ප්‍රකාශ කර ඇත. එම ඔප්පුවේ ගැණුම්කරු ලෙස පුනායා ප්‍රියංජි මැණිකේ එඩ්වඩ්ස්ගේ නම සදහන් වන බැවින් එවැනි අයෙකු නොහදුනන බවත් පෙර අත්සන් කරන ලද විකුණුම් ගිවිසුම අවංගු කිරීම සදහා 10342 දරණ ඔප්පුව අත්සන් කල බවත් ප්‍රකාශ කර සිටි. 10343 දරණ විකුණුම් ඔප්පුවේ සදහන් සාක්ෂිකරුවන් තමා නොහදුනන බවත් ප්‍රකාශ කර ඇත. ගණුදෙනුවට අදාල ඉතිරි රුපියල් මිලියන 35 ක් සදහා සම්පත් බැංකුවේ අංක 006875 දරණ අණකරය මගින් රුපියල් මිලියන 15 ක් හා DFCC බැංකුවේ අංක 085478 දරණ චෙක්පත මගින් රුපියල් මිලියන 20 ක් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත.

**16.** ශිරාණි රොෂාන් ජයසූරිය, අංක 10, නිමල්නා ගාර්ඩන්ස්, කොළඹ 03.
තම පවුලට අයත් හියුජි ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම අධ්‍යක්ෂවරයෙකු ලෙස 1993 වසරේ සිට කටයුතු කරන බවත් සමාගමට අයත් නුවරඑළිය මාගස්තොට පිහිටි දේපලක් ප්‍රසිද්ධ දේපල විකුණුම්කරුවෙකු වන ඉක්‍රම් ඔඩෙයාර් යන අය මාර්ගයෙන් රුපියල් මිලියන 150 කට විකිණීමට අදාල නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බී කරල්ලියද්ද යන අය විසින් ලියා සහතික කල 2013.12.24 දිනැති අංක 10042 දරණ ඔප්පුවේ විකුණුම්කරු ලෙස අත්සන් කල බවත් එම දේපල රියන්ස් එඩ්වඩ්ස් යන අයගේ බිරිද වන පුනායා ප්‍රියංජි මැණිකේ එඩ්වඩ්ස් යන අය විසින් මිලදී ගත් බවත් ප්‍රකාශ කර ඇත. මෙම ඔප්පුවේ විකුණුම්කරුවන් ලෙස තම සහෝදරයා රොහාන් අජිත් ජයකොඩි හා සිලවති ජයකොඩි යන අය අත්සන් කල බවත් මෙම මුදල සදහා NDB බැංකුවේ 2013.12.23 දින අංක 289516 දරණ මුදල් අණකරය මගින් රුපියල් මිලියන 57.5 ක් ද, 2013.12.23 දින අංක 289519 දරණ මුද්ල අණකරය මගින් රුපියල් මිලියන 80 ක්ද, මුදලින් රුපියල් 12.5 ක් ලබාදුන් බව ප්‍රකාශ කර ඇත. ඊට අමතරව මෙම නිවසේ තිබූ ගෘහ භාණ්ඩ වෙනුවෙන් තවත් රුපියල් මිලියන 105 ක් ලබාදුන් බවද, ඉන් රුපියල් මිලියන 50 ක මුදල් අණකරයක් තමන් නමින්ද තවත් රුපියල් මිලියන 55 ක මුදල් අණකරයක් තම සහෝදරයා නමින්ද ලබාදුන් බවට ප්‍රකාශ කර ඇත. එම ඔප්පුවේ සාක්ෂිකරුවන් නොහදුනන බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**17.** රොහාන් අජිත් ජයකොඩි, 32 බී, සර් මොහොමඩ් මැකිම් මාකර් මාවත, කොළඹ 03.
ඉහත ප්‍රකාශය සනාථ කරමින් ප්‍රකාශය ලබා දී ඇත.

**18.** ජුඩ් මනොජ් සෙනවිරත්න, 25/5, සි.එස්.ඒ පෙරේරා මාවත, උයන මොරටුව
තමන් නිව් එයාර් පොර්ට් එක්ස්ප්‍රස් නැමැති කැබ් සර්විස් ආයතනයේ ප්‍රවාහන කලමණාකරු වශයෙන් සේවය කරන බවත්, තමන් ත්‍රිකුණාමලය සාම්පල්තිව් සල්ලි ප්‍රෙද්ශයේ ඉඩමක් මිලදි ගෙන තිබු බවත්, මෙම ඉඩම විකිණීමට තිරණය කර ත්‍රිකුණාමලය මාර්බල් බිච් පදිංචි බ්‍රොකර්වරයෙක් මාර්ගයෙන් රුපියල් 360,000 කට විකිනිමට එකග වි ඔහු විසින් නුවර ක්වින්ස් හෝටලයේදි ඔප්පුව අත්සන් කල බවත් ඒ සදහා නිතිඥවරයෙක් ලෙස පුද්ගලයෙකු ඔප්පු සකස් කරගෙන පැමිණිබවත් ඒ සදහා ඔහු එදිරිපිටදි අත්සන් කිරිමෙන් පසුව අදාල මුදලින් ලබාදු බවත් ප්‍රකාශ කර ඇත. ගැණුම්කාරිය තමන් නොහදුනන බවත් ප්‍රකාශ කර ඇත.

**19.** අබ්දුල් කරිම් ජනබ්දින්, අංක 150, කරමුලවුත්තුපාර, වෙල්ලමනල්, චිනවරාය
තමන් සංචාරකයින් ප්‍රවාහනය කිරිමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන බවත් ත්‍රිකුණාමලය සාම්පල්තිව් ප්‍රෙද්ශයේ හන්ඩ්‍රඩ් එයිට් හෝටලයේ කලමණාකරු ලෙස කටයුතු කරමින් සිටියදි කාල් ප්‍රනාන්දු යන අයට අයත්ව තිබු ඉඩමක් විකිණිම සදහා ගැණුකම්කරුවෙක් සොයන ලෙස තමන්ට දැන්වූ බවත්, ඒඅනුව පුද්ගලයින් කිහිපදෙනෙක්ට දැන්විමෙන් අනතුරුව ඉඩම පරික්ෂා කිරිමට පැමිණි පුද්ගලයෙක් විසින් ඉඩම මිලදි ගැනිමට එකග වි නිතිඥ හා නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බි කරල්ලියද්ද විසින් මහනුවර ක්වින්ස් හෝටලයේදි 2014.03.20 දින අංක 10129 හා 10130 දරණ ඔප්පු මගින් ඉඩම් කැබලි 02 ක් රියන්ස් මහේෂ් කුමාර එඩ්වඩ්ස් යන අයගේ බිරිද නමින් මිලදි ගත් බවත්, ඊට අමතරව ඒ අසල තිබු තවත් ඉඩම් කැබැල්ලක් ජුඩ් මනෝජ් සෙනෙවිරත්න යන අයගේ මිලදි ගැනිමට අදාල 10128 දරණ ඔප්පුව ලියා සහතික කල බවත් එම ඔප්පු වල සාක්ෂිකරුවෙකු ලෙස තමන් අත්සන් කල බවද ප්‍රකාශ කර ඇත. මෙම ඉඩම් මිලදි ගැනිමට අදාල මුදල් රොමේෂ් කරල්ලියද්ද විසින් විකුණුම්කරුවන් වෙත ඒ අවස්ථාවේදි ලබාදුන් බවත් ගැණුම්කාරිය මේ අවස්ථාව සදහා සම්බන්ධ නොවූ බවත් ප්‍රකාශ කර ඇත.

**20.** ජයවිර ආරච්චිගේ අබේරත්න ජයවිර, අංක 169, අරඹේගම, පිළිමතලාව.
තමන් අංක 07 කොළඹ විදිය මහනුවර ලිපිනයේ පිහිටි එම්.බි කරල්ලියද්ද ඇසෝසියේට් ආයතනයේ ලිපිකරු ලෙස වසර 47 ක සිට සේවය කරන බවත්, නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බි කරල්ලියද්ද මහතා ලියා සහතික කරන ලද 2014.01.08 දින අංක 10058,10059 2014.07.10 දින අංක 10259,10260, 2014.07.30 අංක 10274 2014.10.07 දින අංක 10341 හා 2014.10.08 දින අංක 10343 දරණ ඔප්පු වල සාක්ෂිකරුවෙක් ලෙස තමන් අත්සන් කර ඇති බවත් එම ඔප්පු වල විකුණුම්කරුවන් නොහදුනන බවත් නොතාරිස්වරයාගේ ඉල්ලිම පරිදි ඔප්පුවල සාක්ෂිකරුවෙක් ලෙස අත්සන් කල බවත් ප්‍රකාශ කර ඇත.

**21.** චන්ද්‍රපාල රන්දෙනිය, 86/**A/1** පැලව, මුරුතලාව
තමන් අංක 07,කොළඹවීදය මහනුවර ලිපිනයේ පිහිටි එල්.බි කරල්ලියද්ද ඇසෝසියේට් ආයතනයේ ලිපිකරු ලෙස වසර 25 ක පමණ සිට සේවය කරන බවත්, නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බි කරල්ලියද්ද මහතා විසින් ලියා සහතික කරන ලද 2013.12.24 දින අංක 10042 2014.01.08 දින අංක 10058, 10059 2014.07.10 දින අංක 10259, 10260 2014.07.16 දින අංක 10265,10266 2014.07.30 අංක 10274 2014.10.07 දින අංක 10341 2014.10.08 දින අංක 10343 දරණ ඔප්පු වල සාක්ෂිකරුවෙක් ලෙස තමන් අත්සන් කල බවත් එම ඔප්පු වලින් 10058 හා 10059 දරණ ඔප්පු වන විකුණුම්කරුවන් පමණක් තමන් හදුනන බවත් අනෙක් විකුණුම්කරුවන් නොහදුනන බවත් නොතාරිස්වරයාගේ ඉල්ලිම පරිදි එම ඔප්පු වල සාක්ෂිකරුවෙකු ලෙස අත්සන් කල බවත් ප්‍රකාශ කරයි.

**22.** කමලනි ගයාත්‍රි ඥානතිලක, 43/36, පිල්ඩ්විච් උද්‍යානය, රජමහා විහාර පාර, නාවින්න, මහරගම
තම මව වන දෝන හේමලතා සමරසිංහ හා ඇයගේ සහෝදරයන්ට අයත් ගාල්ලේ පිහිටි දේපලක් විකිණිමට අදාලව නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් චන්දන එස්.පි ගොඩකන්දගේ විසින් ලියා සහතික 2014.10.01 දින අංක 1178 දරණ ඔප්පුවේ සාක්ෂිකරුවෙකු ලෙස තමන් අත්සන් කල බව ප්‍රකාශ කර ඇත.

**23.** පොල්හේන ජාසිංහ තන්ත්‍රිගේ ප්‍රියන්ත කුමාර, තල්ගහවත්ත, මිහිරිපැන්න, තල්පේ, ගාල්ල.
නිවස අසල පදිංචිව සිට සුසන්ත නානායක්කාර යන අය හොදින් හදුනන බවත් ඔහුගේ ඔහුගේ සහෝදර සහෝදරියන්ට අයිතිව තිබු දේපලක් විකිනිමට අදාල ඔප්පු ලියා සහතික කල අවස්ථාවට සුසන්ත නානායක්කාර යන අයගේ දැනුම් දිම අනුව සහභාගි වූ බවත් නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් චන්දන එස්.පි ගොඩකන්දගේ විසින් ලියා සහතික කරන ලද 2014.10.01 දින අංක 1178 දරණ ඔප්පුවේ සාක්ෂිකරුවෙක් ලෙස තමන් අත්සන් කල බවත්, විකුණුම්කරුවන් සියලු දෙනා තමන් හදුනන බවත් ප්‍රකාශ කර ඇත.

**24.** කිමාලි ප්‍රනාන්දු, නො 14/2, වෝඩ් පෙදෙස, කොළඹ 07
තමන් පුද්ගලික බැංකු අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරනබවත් බලපිටිය ප්‍රදේශයේ ඉඩමක් මිලදී ගෙන එහි නිවාඩු නිකේතනයක් ඉදිකර එය විකිණීමට තීරණය කිරීමෙන් පසු තැරැව්කරුවන් කිහිපයක් දෙනෙක් දැනුවත් කර තිබූ බවත් ඒ අනුව ඉදිරිපත් වූ රියන්ස් මහේස් කුමාර් එඩ්වඩ්ස් රුපියල් මිලියන 75 කට මෙම දේපල විකිණීමට අදාලව තම නිවසේදී නිතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ටී.බී.එච් දූනුවිල විසින් ලියා සහතික කල 2013.08.04 දින අංක 3659 දරණ ඔප්පුවට විකුණුම්කාරිය ලෙස තමන් අත්සන් කල බවත් ගැණුම්කාරිය ලෙස රියන්ස් මහේෂ් කුමාර එඩ්වඩ්ස්ගේ බිරිද වන පුනායා ප්‍රියංජි මැණිකේ යන අයගේ නම ඇතුළත්ව තිබූ බවත් ඊට අදාල මුදල HSBC බැංකුවේ අංක 0918545001 දරණ ගිණුමෙන් නිකුත් කල අංක 024822 දරණ චෙක්පත මගින් රුපියල් මිලියන 38 ක් හා පැන් ඒෂියා බැංකුවේ අංක 9990059033 දරණ ගිණුමෙන් නිකුත් කල අංක 386344 දරණ චෙක්පත මගින් රුපියල් 35 ක මුදලක්ද, රියන්ස් මහේෂ් කුමාර එඩ්වඩ්ස් විසින් ලබාදුන් බවත් ඉතිරි මුදල එම ස්ථානයේ සිටි බ්‍රෝකර්වරයාට ඔහු විසින් ලබාදෙන බව ප්‍රකාශ කල බවත් ඔප්පුව ලියා සහතික කල නොතාරිස්වරයා හෝ සාක්ෂිකරුවන් තමන් නොහඳුනන බවත් ප්‍රකාශ කර ඇත.

**25.** නානායක්කාර තල්පේ මෙරෙන්ජිගේ දොන් සුසන්ත, 516/2, රෝහල පාර, හෝමාගම.
තමන්ට සහෝදර සහෝදරියන්ට අයත්ව තිබූ ගාල්ල තල්පේ පිහිටි ඉඩමක් විකිණීම සඳහා පුද්ගලයින් කිහිපදෙනෙකුට දන්වා තිබූ බවත් ඒ අනුව ඉදිරිපත් වූ තල්පේ ප්‍රැන්ජිපානි ට්‍රී හෝටලයේ නිසිත රූපසිංහ යන අය එම දේපල මිලදී ගැනීමට ඉදිරිපත් වූ බවත් ඒ අනුව නිතිඥ හා ප්‍රසිද්ධ නොතිරිස් චන්දන එස්.පී ගොඩකන්දගේ විසින් ගාල්ල HSBC බැංකුවේදී ලියා සහතික කල 2014.10.01 දින අංක 1178 දරණ ඔප්පුව මගින් රුපියල් මිලියන 15 කට විකුණූ බවත් ඔප්පුවේ සඳහන් ගැණුම්කාරිය වන පුනායා ප්‍රියංජි මැණිකේ යන අය නොහඳුනන බවත් ගණුදෙනුවට අදාල මුදල නිසිත රූපසිංහ විසින් මුදලින් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත.

**26.** ලසදා සූරියරත්න රත්වත්තේ, පින්නගොල්ල එස්ටේට් බංගලාව, තලාතුඔය
තම පුරුෂයා වන බෙහෙත්ගේ වලව්වේ ඉක්‍රම් ඔඩෙයාර් සමග සිලෝන් රියලිටී. කොම් නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන බවත් තම සමාගම මගින් විකුණන ලද මහනුවර පදිංචි තුසිත විජේසේන යන අයට අයත් දේපලක් රියන්ස් මහේෂ්කුමාර එඩ්වඩ්ස් යන අයගේ බිරිද වන පුනායා ප්‍රියංජි මැණික් එඩ්වඩ්ස් යන අයට රුපියල් මිලියන 300 කට විකුණූ බවත් ඊට අදාලව නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බී කරල්ලියද්ද විසින් 2014.07.16 දින අංක 10265 හා 10266 දරණ ඔප්පු ලියා සහතික කල බවත් එම ඔප්පුවල සාක්ෂිකරුවෙක් ලෙස තමන් අත්සන් කල බවත් ප්‍රකාශ කර ඇත.

**27.** බෙහෙත් ගෙදරවලව්වේ ඉක්‍රම් ඔඩයාර්, පින්නගොල්ල එස්ටේට් බංගලාව, තලාතුඔය.
තම බිරිද සමග reality.com නමින් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවත් එම සමාගම මගින් දේපල වෙළඳාම් අංශයේ තැරැව්කරුවෙකු වශයෙන් කටයුතු කරමින් විකුණන ලද ඉඩම් වලට අදාලව ඔප්පු ලියා සහතික කරන අවස්ථාවලදී තමාද සහභාගිවන බවත් ඒ අනුව රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් විසින් එහුගේ බිරිද වන පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් නමින් මිලදී ගන්නා ලද දේපල වලට අදාලව නිතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බී.කරල්ලියද්ද මහතා විසින් ලියා සහතික කල 2013.12.24 දින අංක 10042, 2014.01.24 දින අංක 10068, 2014.03.20 දින අංක 10128, 10129, 10130 දරණ ඔප්පු වලද තමන් සාක්ෂිකරුවෙකු ලෙස අත්සන් කල බවත් ප්‍රකාශ කර ඇත.

**28.** ඩග්ලස් කාල් ප්‍රනාන්දු , අංක 01, රොක් වුඩ් පෙදෙස, කොළඹ 07 .
තමන් සිවිස් ගුවන් සේවයේ මෙහෙයුම් නිළධාරියෙකු ලෙස සේවය කොට විශ්‍රාම ලබා සිටින බවත් තමන් හඳුනන ජර්මන් ජාතික තෝමස් බර්නිෂේක් හා එල්කේ බර්නිෂේක් යන අයට අයත්ව තිබූ ත්‍රිකුණාමළය සාම්පල්තිව් පිහිටි අක්කර 03 යි රූඩ් 01 යි පර්චස් 32.65 ක් විශාල ඉඩම විකුණාදීම සඳහා තමාවෙත ඇටර්නි බලපත්‍රයක් ලබාදුන් බවත් එම නිවසට පිවිසීමට පටු මාර්ගයක් තිබූ හෙයින් මෙම ඉඩම විකිණීමට අපහසුවූ බැවින් ඉඩමේ අනෙක් පසින් පිහිටි ඉඩමක් පිවිසුම් මාර්ගය සකස්කර ගැනීම සඳහා නිතීඥ හා ප්‍රසිද්ධ නෙතාරිස් එස්.පුලේන්ද්‍රන් විසින් ලියා සහතික කල 2012.01.26 දින අංක 3523 හා 3524 දරණ ඔප්පු මගින් පර්චස් 28 ක ඉඩමක් මිලදී ගත් බවත් ඒ අනුව මෙම ඉඩම මිලදී ගැනීමට ඉදිරිපත්වූ බ්‍රෝකර්වරයෙකු වන ඉක්‍රම් ඔඩයාර් මාර්ගයෙන් නිතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස් රොමේෂ් කරල්ලියද්ද විසින් ලියාසහතික කල 2014.03.20දිනැති අංක 10129හා 10130දරණ ඔප්පු මගින් රු. 1,302,928/=ට හා රු. 42,825,320/= ට රියන්සි එඩ්වඩ්ස් යන අයගේ බිරිද වන පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය නමින් විකුණූ බවත් ඊට අදාල මුදල් චෙක් පත් හා බැංකු අණකර මගින් රොමේෂ් කරල්ලියද්ද විසින් ගමා වෙත ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත.

29. මැදගොඩගේ තුසිත විජයසේන, නො.10/1, රිඩ් මාවත, කොළඹ 07. තමන් කැන්ඩි සිටි සෙන්ටර් කළමණාකාර අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන බවත් තමන්ට අයත්ව තිබූ ඉඩම් කැබලි දෙකක් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.බී.කරලිලියද්ද විසින් ලියා සහතික කරන ලද 2014.07.16 දිනැති අංක 10265 හා 10266 දරණ ඔප්පු මගින් ඉක්‍රම් ඔඩයාර් නැමති ඉඩම් බ්‍රෝකර් වරයා මාර්ගයෙන් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් යන අයට රු. මිලියන 300 ට විකුණූ බවත් ඔහුට අදාල මුදල් රොමේෂ් කරල්ලියද්ද විසින් හැටන් නැෂනල් බැංකුවේ අණකර අංක 005418 මගින් රු. මිලියන 116 ක්ද අංක 304438 දරණ අණකරය මගින් රු. මිලියන 175 ක්ද වශයෙන් ගෙවූ බවත් ඉතිරි මුදල බ්‍රෝකර් ගාස්තුව වශයෙන් අඩුකර ගත් බවත් ප්‍රකාශ කර ඇත.

30. රුවන්පුර නිමේෂා නිවන්ති, කළමණාකරු, එකවුන්ටින් ඇන්ඩ් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ්, අංක 212, ද සේරම් පෙදෙස, කොළඹ 10. තමන් 2015 වසරේ සිට ඉහත සමාගමට අනුබද්ධව මැනේජර්ස් ඇන්ඩ් සෙකට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් යටතේ සමාගම් ලේකම්වරු වශයෙන් කටයුතු කරනු ලබන බවත් ඒ තමන් යටතේ රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ යන අය අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන ද මැන්ෂන් කැන්ඩි ප්‍රයිවඩ් ලිමිටඩ් නැමති පීවී85730 යටතේ සංස්ථාගතකර ඇති බවත් එම සමාගමේ සමාගම් ලේකම් වශයෙන් 2014.05.31 දින සිට මැනේජර්ස් ඇන්ඩ් සෙකට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් කටයුතු කරන බවත් 2015.09.17 වන දින සිට නීතිඥ සුදර්ශන දේශප්‍රිය යන අයගේ උපදෙස් අනුව හයි රයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් පීවී10844 යටතේ 2015.09.17 දිනද , කළම්බු ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් පීවී108493යටතේ 2015.09.17 දිනද , සූර්යා ඉන්ටර් නැෂනල් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් පීවී111792 යටතේ2016.02.10 දිනද, ආශා මැන්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් පීවී 116259 යටතේ 2016.09.06 දිනද ට්‍රැම්වෙල් කන්සල්ටන්සි සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් නැමති සමාගම පීවී 118593 යටතේ 2016.12.08 දිනද බොන්ඩ් ස්ට්‍රීට් මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් නැමති සමාගම පීවී118621 යටතේ 2016.12.08 දිනද රෝයල් ටර්ෆ් ක්ලබ් ජීඒ 3072 යටතේ 2015.09.01 දිනද සංස්ථාගතකරන ලද බවත් මෙම සමාගම් අතුරින් අලුතින් සංස්ථාගත කරන ලද සමාගම්වල ව්‍යාපාර කිසිවක් සිදු නොවන බවද අනාවරණය කර ඇත.

31. නෝලියන් යුක්තික මුණසිංහ දිසානායක, කළමණාකරු, මාස් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් ප්‍රයිවට් ලිමිටඩ් හා මාගමගේ සහ සමාගම, අංක 32, පැපිලියාන පාර, නුගේගොඩ. 2017 වසරේ සිට මෙම සමාගමේ කළමණාකරු වශයෙන් සේවය කරන බවත් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ යන අය අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරනඑඩ්වඩ්ස් ප්ලාන්ටේෂන් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් පීවී 62079 යටතේ 2007.11.19 දිනද එඩ්වඩ්ස් එස්ටේට්ස් ප්ලාන්ටේෂන් ප්‍රයිවට් ලිමිටඩ් පීවී 62160 යටතේ 2007.11.26 දිනද එඩ්වඩ්ස් ඉන්වෙස්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් නැමති සමාගම පීවී 63280 යටතේ 2008.03.04 දිනද, ග්‍රීන්ඩ් ෆිල්ඩ් කන්සල්ටන්සි සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් පීවී 62079 යටතේ 2012.10.02 දිනද සංස්ථාගතකර ඇති බවත් ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් අත්වැල පදනම ජීඒ 2770 යටතේ 2012.12.13 දින ද සංස්ථාගත කර ඇති බවත් එම සමාගම් වල සමාගම් ලේකම් වශයෙන් මාස් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමත් විගණක වශයෙන් මාගමගේ සහ සමාගමත් කටයුතු කරන බව අනාවරණය කර ඇති අතර නිසි පරිදි විගණන හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරිම සිදු නොවන බවද ප්‍රකාශ කර ඇත.

32. වෞද්‍රි මැණික් සල්ගාදු, අධ්‍යක්ෂ, මැනේජර්ස් ඇන්ඩ් සෙකට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්, අංක 8, ටිකල් පාර, කොළඹ 08. 1998 වසරේදී පමණ ඉහත සමාගමේ අධ්‍යක්ෂ වශයෙන් සම්බන්ධවී මේ දක්වා කටයුතු කරනු ලබයි. තම සමාගම මගින් රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ්ස් යන අය අධක්ෂවරුන් වශයෙන් කටයුතු කරන ද මැන්ෂන් කැන්ඩි ප්‍රයිවඩ් ලිමිටඩ්, හයි රයිස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්, කළම්බු ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්, සූර්යා ඉන්ටර් නැෂනල් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, ආශා මැන්ෂන් ප්‍රයිවට් ලිමිටඩ්, ට්‍රැම්වෙල් කන්සල්ටන්සි සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් , බොන්ඩ් ස්ට්‍රීට් මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්, රෝයල් ටර්ෆ් ක්ලබ් යන සමාගම් වල සමාගම් ලේකම් වශයෙන් කටයුතු කරන බවත් ද මැන්ෂන් කැන්ඩි ප්‍රයිවඩ් ලිමිටඩ් නැමති සමාගම 2014.01.08 දින කොටස් රු. 236,800,000/= ට රියන්සි මහේෂ් කුමාර එඩ්වඩ්ස් හා පුනායා ප්‍රියන්ජි මැණිකේ එඩ්වඩ ස් යන අය මිලදී ගැනීමෙන් අත්පත් කර ගෙන ඇති බවත් 2018 වසරෙ දක්වා වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇති බවත් අනෙකුත් සමාගම් වල වාර්ෂික වාර්තා ලේකම් ගාස්තු නොගෙවීම මත ඉදිරිපත් කර නොමැති බවත් මෙම සමාගම් වල ලේකම් තනතුරෙන් 2019.06.01 දින සිට ඉවත්වන බව සමාගම් රෙජිස්ට්‍රාර් වෙත දන්වා ඇති බවත් අනාවරණය කර ඇත.

33. නාවලගේ රසික ලක්මාල් ප්‍රනාන්දු, අධ්‍යක්ෂ, අර්නස්ට් ඇන්ඩ් යන්, අංක 201, ද සේරම් පෙදෙස, කොළඹ 10. 2005 වසරේ සිට අර්නස්ට් ඇන්ඩ් යන් සමාගමේ පුහුණු භාහිර විගණක නිළධාරි වශයෙන් සේවයට